# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නිකිණි අමාවක පෝ දා, රාජ්‍ය වර්ෂ 2020 අගෝස්තු 18 අඟහරුවාදා, BUDUSARANA,TUESDAY AUGUST 18, 2020

55 වැනි කාණ්ඩය, 10 වැනි පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 20 මිල රු. 40.00



යස කුල පුතුගේ යහළුවන්ට දහම් දෙසීම

සිතුවම - හර්ෂ ගුණවර්ධන



# ක්‍රෝධය මාරයා වැනි ය



ගැටහැත්ත බෝපැත්ත
ශ්‍රී සෝමානන්ද
ඉංග්‍රීසි මාධ්‍ය මූලික පිරිවෙන්
විහාරාධිපති ශාස්ත්‍රවේදී
**රාස්සගල චන්දකිත්ති හිමි**

**බුද්ධ වචනයට අනුව නිරන්තරයෙන් ක්‍රෝධයෙන් යුතු ව, කිපෙන සුළු ස්ත්‍රිය හෝ පුරුෂයා කෙරෙහි පහත සඳහන් කරුණු ඔස්සේ විපාකයන් විඳීමට සිදු වන බව කෝධන සූත්‍රයේ සඳහන් ය.**

කිපෙන ගති ඇති, ක්‍රෝධ සිත් ඇති තැනැත්තා සැම විට ම ක්‍රෝධයෙන් යුතු සිත් ඇති වීම නිසා එයින් පීඩා විඳියි. මුහුණෙහි ප්‍රසන්න භාවය වෙනුවට අප්‍රසන්න පෙනුමක් සහිත වූවේ වෙයි. දුර්වර්ණ බවට පත් වේ. දුර්වර්ණ ස්වභාවය නිසා ම කා අතරත් අප්‍රසාදයට ලක් වේ. කිසිවෙක් ප්‍රිය නො කරති.

ක්‍රෝධයෙන් මත් වූ, ඇඩි වූ සිතක් ඇති තැනැත්තා කයින් හා වචනයෙන් පව් සිදුකර ගනියි. ඒ නිසා ම ධනයෙන් පිරිහීමට ලක් වේ. අනුන්ගෙන් සිඟමන් යදිමින් ජීවත් වීමට සිදු වේ.

සතුරා කෙරෙහි වූවත් මෛත්‍රිය වඩනවා වෙනුවට ක්‍රෝධයෙන් සිත දූෂ්‍ය කොට ජීවත් වීම නිසා ක්‍රෝධ කරන්නා නින්දාවට ලක් වෙයි. තමා අවට සිටින ඥාතී මිත්‍රාදීහු පවා එම පුද්ගලයා අත හැර දමා යති. ක්‍රෝධ කිරීමේ අකුසලය නිසා ම මෙලොව කිසිවෙකුගේ පිළිසරණක් නැති හුදෙකලා වූ අසරණයෙකු බවට පත් වෙයි.

ක්‍රෝධය අනර්ථය පිණිස ම වේ. කිසි ලෙසකින්වත් සිදුවන යහපතක් නම් නැත. ක්‍රෝධ කිරීම යනු කුසලය වෙනුවට අකුසලයට අත වැනීමකි. සිත තව තවත් ප්‍රකෝපයට පත් කරන්නකි. මානසික නිදහස, සැහැල්ලු බව නැති කරන්නකි. අපාය වැළඳ ගැනීමකි.

කිපෙන්නා අර්ථය නො දන්නේ ය. අධික කිපීම නිසා සමථ විදර්ශනා ධර්ම නො දන්නේ ය. සමථ විදර්ශනා සඳහා වන මාර්ගය ද නො දන්නේ ය. නො පෙනෙන්නේ ය.

ක්‍රෝධයෙන් මඩනා ලද සිත් ඇත්තා යහපතක් යැයි සලකා අයහපතක් කරයි. පසු ව ඒ ගැන කම්පා වෙයි. ගින්නකින් දැවී ගිය අයෙකු සේ වෙයි. තැවෙයි. පීඩා විඳියි. අවසානයේ දුකට පත් වේ.

ක්‍රෝධ කරන්නාට තමා කරන ක්‍රියාවන් පිළිබඳ ලජ්ජාව කියා දෙයක් නැත. ඒ සම්බන්ධ ව බියක් ද නැත. තමා කතා කරන වචන ශිෂ්ට ලෙස භාවිත නො කරයි. අසභ්‍ය , අසරු, අනර්ථ වචන ම කතා කරයි. එසේ ම, එලෙස ක්‍රෝධයෙන් යුතු තැනැත්තාට පිහිටක්, සරණක් හිමි නො වේ.

**ක්‍රෝධයෙන් මඬනා ලද සිත් ඇත්තා යහපතක් යැයි සලකා අයහපතක් කරයි. පසු ව ඒ ගැන කම්පා වෙයි. ගින්නකින් දැවී ගිය අයකු සේ වෙයි. තැවෙයි. පීඩා විඳියි. අවසානයේ දුකට පත් වෙයි.**

යහපත්, ධාර්මික ක්‍රියාවෙන් වෙන් වූ, තැවීම පිණිස වන යම් ක්‍රියාවක් වේ නම්, කිපෙන්නා එවැනි ක්‍රියා කරයි. එබඳු ක්‍රියා යහපත් ක්‍රියා ලෙස ම සලකයි.

කිපෙන්නා තම පියා නැසීමට යොමු වේ. මව නැසීමට යොමු වේ. රහතුන් නැසීමට යොමු වේ. ක්‍රෝධය නිසා ම පුහුදුන් මිනිසුන් නැසීමට යොමු වේ. එවැනි පාපකාරී කාය දුෂ්චරිතයන් කරයි. පව් රැස් කර ගනියි.

වෛරයෙන් යුතු ක්‍රෝධ ගති ඇති තැනැත්තා තමා කෙරෙහි ම අතිශයින් සතුටු වෙයි. විවිධ අරමුණු කෙරෙහි ඇළුණු තැනැත්තා ක්‍රෝධය නිසා ම තමා වූව ද නසා ගැනීමට පෙළඹෙයි.

ක්‍රෝධයෙන් සිත පිරී ඇති, හොඳ නරක නො දැන මුළාවට පත් වූ තැනැත්තා කඩුවකින් වූව ද තමා නසා ගනියි. විෂ සහිත යමක් කැමෙන් හෝ ජීවිතක්ෂයට පත් වෙයි. ගෙල වැළ ලා ගෙන හෝ ජීවිතය නැති කර ගැනීමට පෙළඹෙයි. මහා ගල් පර්වතයකින් වූව ද පහළට පැන මිය යයි.

මේ ආදී වශයෙන් ක්‍රෝධ කරන්නන්, ක්‍රෝධය නිසා අනුන්ට පීඩා සිදු කරන්නා සේ ම, අවසානයේ ක්‍රෝධය නිසා තමා ද විනාශ කර ගන්නා ආකාරය මෙම සූත්‍රයේ මැනවින් දක්වා ඇත. එම නිසා ක්‍රෝධයෙන් සිත මුදා, මෛත්‍රියෙන් සිත පිරිසුදු කර ගැනීම සඳහා කළ යුතු පිළිවෙත අවසානයේ දී මෙසේ දක්වා ඇත.


“ඉතා'යං කොධ රූපෙන
මච්චුපාසො ගුහාසයො
තා දමෙන සමුච්ජින්දෙ
පඤ්ඤා විරියෙන දිට්ඨියා“

එහි අදහසට අනුව මාරයාගේ ස්වරූපය අප තුළ ක්‍රියාත්මක වන්නේ ක්‍රෝධය පරිද්දෙනි. ක්‍රෝධය මාරයා වැනි ය, යනු එහි සරල අදහසයි. එම මාරයා හෙවත් ක්‍රෝධය සිතට ඒම නැති කළ හැක්කේ, වැළැක්විය හැක්කේ තම සිත තැන්පත් කර ගැනීමෙනි. සංවර හා සංසුන් කර ගැනීමෙනි. සිත දමනය කර ගැනීමෙනි. ක්‍රෝධයේ විපාකයන් දකිමින් නුවණැසින් ක්‍රියා කිරීමෙනි. උත්සාහයෙන් හා වීර්යයෙන් යුක්තව සම්‍යක් දෘෂ්ටිය හෙවත් යහපත් දැකීමක් සහිත ව කටයුතු කිරීමෙනි. එසේ ම ක්‍රෝධ කිරීමෙන් ඇති වන ආදීනවයන් සැලකිල්ලට ගනිමින් එයින් වෙන් ව කටයුතු කිරීමෙනි.

## ධර්මය ආරක්ෂා කර ගනිමු

**ධර්මය වස්තුවක් වශයෙන් පෙන්වන්නට ඇති දෙයක් නොවන බැවින් ධර්මයට කරන පූජාව ධර්මධරයන්, ධර්ම කථිකයන් කෙරෙහි කළ යුතු බව තථාගතයන් වහන්සේ වදාළ සේක.**

එබැවින් ධර්මයට පුදනු කැමැතියන් විසින් ඒ දෙය ධර්ම පූජා වශයෙන් ධර්මධරයන් වහන්සේලාට, ධර්ම කථිකයන් වහන්සේලාට පිදිය යුතු ය. ධර්මය ලියා තිබෙන්නා වූ ද, මුද්‍රණය කර තිබෙන්නා වූ ද පොත් පත් ධර්ම චෛත්‍යයෝ ය. ධර්මයට ගරු කිරීමක් වශයෙන් ඒවාට ද වැඳුම් පිදුම් කළ හැකි ය. ධර්මය දේශනය කරන කල්හි ඉතා ගෞරවයෙන් එය ඇසිය යුතු ය. උසසුන්වල හිඳ බණ ඇසීම ද, ධර්ම කථිකයන් වහන්සේට පිටුපා බණ ඇසීම ද, ධර්මකථිකයන් වහන්සේ දෙසට පා දිගු කර ගෙන හිඳ බණ ඇසීම ද ධර්මයට කරන අගෞරවයෝ ය. තව ද දහම් දෙසන තැනක එය නො අසා අන් වැඩක යෙදීම ද, බණ අසන අන්‍යයන්ට බාධා විය හැකි පරිදි කථා කිරීම ද ධර්මයට කරන අගෞරවයෝ ය. ගෞරවයෙන් බණ ඇසීම පිනක් වන්නාක් මෙන් ම ධර්මයට අගෞරව කිරීම පාපයක් වන බව දත යුතු ය. තථාගත ධර්මය පිරිහෙන්නට නොදී ආරක්ෂා කිරීම ද බෞද්ධයාගේ යුතුකමෙකි. ධර්මය ආරක්ෂා වීමට කළ යුතු දේ නම් දහම් පොත් පත් සුලභ කිරීම ය. ධර්මාචාර්යවරයන්ට හා ධර්මය උගන්නා ශිෂ්‍යයන්ට අනුබල දීමය. ධර්ම දේශනා මාර්ගයෙන් මහජනයා අතර ධර්මය පතුරුවාලීම ය යන ආදිය යි.



**රේරුකානේ චන්දවිමල නා හිමි**

සර්වඥ ශාසනය ගෙන යන්නා වූ උන්වහන්සේලාට උපකාර කළ යුතුය. උන්වහන්සේලාගේ සුව දුක් ගැන කල්පනා කළ යුතු ය. උන්වහන්සේලාට සැම කල්හි ම ගෞරව කළ යුතු ය. උන්වහන්සේලා දුටු විට හුනස්නෙන් නැගිටිය යුතු ය. උන්වහන්සේලා ඉදිරියේ උසසුන්වල නො හිඳිය යුතු ය. වහන් පය ලා හිස් වැසුම් ලා නො සිටිය යුතු ය. උන්වහන්සේලා හා කතා කරන කල්හි ගිහියන් හා කතා කරන්නාක් මෙන් කතා නො කොට, ගෞරවයෙන් කතා කළ යුතු ය.

භික්ෂූන් වහන්සේලා ආශ්‍රය කිරීමේ දී උන් වහන්සේලා හා අධික මිත්‍රත්වයට නො පැමිණ ගිත්ත ආශ්‍රය කරන්නාක් මෙන් පරෙස්සමින් ආශ්‍රය කළ යුතු ය. භික්ෂූන් වහන්සේ හා අධික මිත්‍රත්වයට පැමිණිය හොත් උන් වහන්සේ කෙරෙහි ගෞරව නැති වීමෙන් ද, සඟ සතු ද, තමාගේ ප්‍රයෝජනයට ගන්නට පුරුදු වීමෙන් ද අපාගත විය හැකි ය.

**රේරුකානේ චන්දවිමල නා හිමියන්ගේ**
**'බෞද්ධයාගේ අත්පොත'** ඇසුරිනි

නිකිණි අමාවක පෝදා

දම් දෙසුම

# ජීවිතයට ශක්තිමත් අරමුණක් ඕනෑ





රුහුණු විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ
සහකාර කථිකාචාර්ය
ශාස්ත්‍රපති
**ගිරාඹේ ධම්මරුචි හිමි**

නමෝ තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

**සේලෝ යථා ඒක ඝනෝ වාතේන න සමීරති
ඒවං නින්දා පසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා**

**සමාජයෙහි ජීවත්වන බොහෝ පුද්ගලයින් අටලෝ දහම හමුවෙහි කම්පිත වෙති. දුක සැප ආදිය සමව විඳ දරා ගැනීමට නොහැකිව බොහෝ පිරිස් තම ජීවිතයෙන් පවා සමුගනී. නිතර කළකිරීමෙන් ජීවත්වන මොවුන් තුළ කිසිදු පෞරුෂ ලක්ෂණයක් දැකිය නොහැකි ය.**

ඒ නිසාම ධම්මපදයේ දී මනෝ විද්‍යාත්මක අවධාරණය කරනු ලබන්නේ සියලු සැප දුක් හමුවේ සියල්ල විඳ දරාගෙන මැදහත් සිතින් යුක්තව වාසය කිරීම ඉතා වැදගත් වන බවයි. ඒ තුළින් පුද්ගල පෞරුෂ සංවර්ධනයක් නිරායාසයෙන් ම ඇතිවන ආකාරය මෙම ගාථාවෙන් පැහැදිලි වේ.

පුද්ගලයෙකුට යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා දැඩි උත්සාහයක් තිබිය යුතු ය. උත්සාහයෙන් තොරව කිසිදු අරමුණක් ඉටුකර ගත නොහැකි ය. උත්සාහය තුළින් පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනයක් ඇති වන අතර උත්සාහයක් නැති පුද්ගලයා සතු ව කිසිදු පෞරුෂ ලක්ෂණයක් දැකිය නොහැකි ය. ඒ අනුව පුද්ගලයාගේ ලෞකික ජීවිතය මෙන් ම ලෝකෝත්තර ජීවිතය සාර්ථක කර ගැනීමට නොපසුබට උත්සාහයය ඉතා වැදගත් වෙයි.

නූතනයේ බොහෝ පුද්ගලයන්ගේ පෞරුෂය හීන වීමට ජීවත්වන වටපිටාව, පරිසර හා සමාජය ප්‍රධාන සාධකයක් වී ඇත. මෙහි දී සමාජ ඇසුර ඉතාම වැදගත් වේ. පෞරුෂ හීන පුද්ගලයන් ඇසුරු කිරීමෙන් නිරායාසයෙන් ම අන්‍යයන්ගේ ද පෞරුෂය හීන භාවයට පත්වේ. යහපත් දැක්මකින් යුත් කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීමෙන් පුද්ගල පෞරුෂය සංවර්ධනය කරගත හැකි බව ධම්මපදයේ දී මනෝවිද්‍යාත්මක උපදේශනයන් ලබා දෙනු ලබන්නේ මේ ආකාරයෙනි.

"න භජේ පාපකේ මිත්තේ – න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ භජේථ පුරිසුත්තමේ"

පවිටු මිතුරන් ඇසුරු කිරීමෙන් නොයෙක් ආකාරයෙහි දුරාචාරයන්ට පුද්ගලයන් යොමු වේ. මත්පැන් පානය කිරීම, සූදුව, ජීවිතයට අරමුණක්, බලාපොරොත්තුවක් නොමැති වීම යනාදි වශයෙන් පුද්ගලයන් බොහෝ විෂමාචාරයන්ට යොමු වේ. ඒ හේතුවෙන්ම සමාජයෙන් කොන්වීම, නොපිළිගැනීම පවට බර වීම ආදී කරුණු මුල්කොටගෙන පුද්ගලයා පරිහානියට පත්වන අතර, එසේ නොවීමෙන්, කලණ මිතුරු ඇසුරින් පුද්ගල පෞරුෂය සංවර්ධනයට පත්ව මනා පෞරුෂයෙන් හෙබි පුද්ගලයෙකු ලෙසද සමාජය තුළ ජීවත්විය හැකිය.

"එසේම යහපත් ඇසුරක් නොමැති නම් තනිවම වාසය කිරීම ඉතා වැදගත් වෙයි". එයින් පුද්ගල පෞරුෂයත් සංවර්ධනයත් ඇතිවන බව ඉතා පැහැදිලිය.

යම් පුද්ගලයෙක් බොරුවෙන් වංචාවෙන් යුක්තව කටයුතු කරන බව සමාජය දැනගත් විට ඔහු සමාජයෙන් කොන් වේ. එසේ ම ගොඩනගා ගෙන තිබූ පෞරුෂය ද බිඳ වැටෙන අතර ඔහුගේ විශ්වාසවන්ත භාවය ද බිඳේ. එවිට සමාජය ඔහු පිළිගන්නේ විශ්වාස කළ නොහැකි පුද්ගලයෙකු ලෙස ය. එම නිසා පෞරුෂ සංවර්ධනයේ දී බුදු දහම මනෝවිද්‍යාත්මක ව පෙන්වා දෙනු ලබන්නේ සමාජයෙහි ජීවත්වන විට විශ්වාස වන්ත භාවයෙන් යුක්තව, අන්‍යයන්ගේ සිත් දිනාගෙන ජීවත් විය යුතු බවයි. ඒ අනුව "අවැඩදායක වචන දහක් වුවත් උසස් නොවන අතර වැඩ දායක එක් වචනයකින් පුද්ගලයා උසස් පුද්ගලයෙක් වන බවට ධම්මපදයේ දී අනාවරණය වේ."

යම් පුද්ගලයෙක් තමන් ගැන පමණක් සිතමින් අන්‍යයන් ගැන නොසිතමින් කටයුතු කිරීම, නැතහොත් ආත්මාර්ථකාමීත්වයෙන් යුක්තව ජීවත් වීමෙන් පෞරුෂය පරිහානියට පත්වෙයි. ඒ නිසා ජීවත් වන කාලය තුළදී කිසිම පුද්ගලයෙකුට හිංසාවක්, පීඩාවක්, කරදරයක් නොකොට ජීවත් විය යුතු ය. ධම්මපදයේ දී අවධාරණය කරනු ලබන්නේ "සියල්ලෝ දඬුවමට බිය වෙත්, සියල්ලෝ මරණයට බිය වෙත්, එබැවින් අනුන් තමාට සමාන සේ සිතා අනුන්ට හිංසා නොකළ යුතු ය. අනුන්ට හිසා නොකරවිය යුතු ය" යනුවෙනි.

පුද්ගලයා කුමන ආකාරයෙන්වත් පශ්චත්තාපයට පත්වන කටයුතු නොකළ යුතු ය. එසේ කිරීම තුළින් පුද්ගල පෞරුෂය විනාශ විය හැකි ය. විශේෂයෙන් තරුණ කාලයේ දී අනාගත තම ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගත යුතු ය. තමාට පුළුවන් හැකි සෑම අවස්ථාවක දී ම අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ යුතු ය. එසේ කටයුතු නොකොට සිටීමෙන් පුළුවන්කල එම කාලය කා දමමින් කටයුතු කිරීමෙන් පුද්ගල පෞරුෂය පසුකාලීන ව විනාශයට පත්වෙයි.

එසේම තමන්ට තමන් හැර අන් පිහිටක්, පිළිසරණක් නොමැති බව තේරුම් ගෙන ජීවත් විය යුතු ය. අනුන්ගෙන් යැපෙන, බලාපොරොත්තු වන අයුරින් ජීවත් නොවිය යුතු ය. එසේ වීමෙන් පුද්ගල පෞරුෂ සංවර්ධනයේ දී ඉතාම වැදගත් කරුණක් ලෙස තමාගේ පෙර වැරදි නිවරදි කරගෙන ජීවත්වීම ඉතා වැදගත් ය. සමාජයෙහි ජීවත් වන බොහෝ දෙනෙකු අතින් වැරදි සිදුවේ. එය මිනිස් ස්වභාවයකි. සිදු වූ නොවූ වැරදි නිවරදි කරගෙන යමෙකුට ජීවත්විය හැකි නම් ඔහුගේ පෞරුෂය ඉතාම සංවර්ධනය වූවකි. "පෙර පමා වුවත් පසුව පමා නොවන තැනැත්තා වලාකුළින් නිකුත් වූ සඳමෙන් මේ ලෝකය බබුළුවයි" යනුවෙන් ධම්මපදයේ දී පෙන්වා දේ.

පුද්ගල පෞරුෂය ඇතිකර ගැනීමේ දී ඉවසීමේ ගුණය ඉතාම වැදගත් වේ. ඉවසීමෙන් යුක්තව කටයුතු කරන්නාගේ පෞරුෂය සංවර්ධනය වන බව ධම්ම පදයේ දී මනෝවිද්‍යාත්මක ව අවධාරණ කරන්නේ "ඛන්තිපරමං තපෝ තිතික්ඛා" යනුවෙනි.

යමෙක් බියෙන් කටුයතු කරන්නේ නම් ඔහු පෞරුෂයෙන් හීන වූ පුද්ගලයකි. මෙලෙස පෞරුෂයෙන් හීන වූ පුද්ගලයන් නොයෙක් දේ වලින් පිහිට ආරක්ෂාව පතයි. ධම්ම පදයේ දී මනෝ විද්‍යාත්මක අවධාරණය කරනු ලබන්නේ මෙලෙස බියට පත් වූවන් නොයෙක් නොයෙක් දෑ හි සරණ පතන බවයි. එම නිසා නිසි පෞරුෂ සංවර්ධනයට බිය පහ කරගත යුතු ය. එසේම පෞරුෂ සංවර්ධනයේ දී නිරෝගීමත් භාවය ද, ලද දෙයින් සතුටු වීම ද විශ්වාසවන්ත භාවයෙන් යුක්තව ජීවත් වීම ද ඉතාම වැදගත් වේ. මෙම කරුණු ද පෞරුෂ සංවර්ධනයේ දී බෙහෙවින් ම උපකාරීව වන බව ධම්ම පදය අවධාරණය කරයි.

බුදු දහමට අනුව පුද්ගලයෙක් මානයෙන් ක්‍රෝධයෙන් සංයෝජන ධර්මවලින් යුක්තව වාසය කරන්නේ නම්, එම පුද්ගලයා ද පරිහානියට පත් වේ.


පුද්ලයෙකුට පෞරුෂයක් නගා ගැනීමට ආකාර තුනක් බලපානු ලබයි. එනම් සිතින් පෞරුෂයක් ගොඩනගා ගත හැකි ය. කයින් හා වචනයෙන් පෞරුෂයක් ගොඩනඟා ගත හැකිය. එසේ පුද්ගල පෞරුෂ පරිහානියට ද බලපානු ලබන්නේ ද සිත කය වචනය යන තිදෙරයි.

> **තමන්ට තමන් හැර අන් පිහිටක්, පිළිසරණක් නොමැති බව තේරුම් ගෙන ජීවත් විය යුතු ය. අනුන්ගෙන් යැපෙන බලාපොරොත්තුවෙන් ජීවත් නොවිය යුතු ය.**

# රැස් කිරීම

## ආනන්ද සිටුවර කතා පුවත

> මරණාසන්න ව යහනෙහි වැතිර සිටින විට මරණ වේදනාවෙන් ඇට, සන්ධි තුළින් අධික වේදනාවක් එනවිට දෑස වැසෙනවා. ඒ සමඟම පරලොව දී ඇස් ඇරෙනවා. ඒ ලෝකයේ තමා අවට තිබෙන දේ තමයි එවිට ඔහුට පෙනෙන්නේ. දිනකට තුන් වරක් නහවා, සුවඳ මල් පළඳවා තැබුව ද තමාට තමා හෝ පිහිට නොවන ආකාරයටයි එදාට කරුණු යෙදෙන්නේ.



**තෙරුවන් කෙරෙහි සිතෙහි හට ගන්නා සැකය නැති කොට ගෙන සසර දුකින් මිදෙන අන්දම කියනු පිණිස ආනන්ද සිටුවරයාගේ කතා පුවත ප්‍රකට වූවක්.**

**සැවැත් නුවර ආනන්ද නමින් සිටුවරයෙක් ජීවත් වුණා. ඔහුට අසූ කෝටියක් ධනය තිබුණා. ඔහු අව අටවක සහ පසළොස්වක පෝ දිනවල දී තම ඥතීන් නිවසට රැස්කර ඔවුන් ඉදිරියේ තම පුතාට මෙසේ අවවාද කළා.**

"පුතේ අසූ කෝටියක් වූ ධනය මහා විශාල ධනයක් කියා හිතන්න එපා. අවශ්‍ය වේවා, අනවශ්‍ය වේවා මේ ධනය වියදම් කරන්න එපා. තව තවත් ධනය මෙයට එකතු කර ගන්න. එක මස්සක් (රන් කළඳක් බර කාසියක්) බැගින් වියදම් කළත් මේ ධනය අවසන් වෙනවා. වේයාගේ මුඛය කුඩා වුව ද කම්මැලි නො වී ඌ ගොඩනගන තුඹස කො තරම් විශාල ද? ඒ අනුව නුඹ ද මේ ධනයට තව තවත් ධනය රැස්කර ගන්න. අඳුන් පුරවා ඇති බඳුනකින් අඳුන් ගෙන දිනපතා ඇස් ආලේප කරන විට ඒ බඳුනේ අඳුන් අවසන් වෙනවා. ඒ බව දැන වස්තුව වියදම් නො කොට සිටිය යුතු" යැයි තම පුතාට උදේ, දවල්, රාත්‍රි උපදෙස් ලබා දෙනවා.

ඔහු කෙ තරම් අනුන්ට උපදෙස් ලබා දුන්න ද, ඔහුට උපදෙස් දෙන්නට කිසිවෙක් සිටියේ නැහැ. තමා නිදන් කළ ධනය ඔහු තම පුතාටවත් කිව්වේ නැහැ. ඉතාමත් ලෝභ සිතින්, කිසිදු සැපක් නො විඳ මේ සිටුවරයා මිය පරලොව ගියා.

ආනන්ද සිටුවරයා මියගිය බව අසා කොසොල් රජු ඔහුගේ පුතාට ඒ සිටු තනතුර පිරිනැමුවා.

මේ සිටුතුමා මියගොස් ඒ නගරයේ ම සැඩොල් පවුලක කාන්තාවකගේ කුසේ පිළිසිඳ ගත්තා. ඒ ගමේ පවුල් දහසක් ජීවත් වුණා. ඔවුන් බැළ මෙහෙවර කරමින් ඉතාමත් දුක සේ ජීවත් වුණා. ආනන්ද සිටුතුමා මියගොස් සැඩොල් කාන්තාවගේ කුස තුළ පිළිසිඳ ගත් දා සිට සියලු සැඩොල් පවුල්වල අයගේ රැකියා අහිමි වුණා. "අපට මෙතෙක් කල් මෙහෙම දෙයක් සිදුවෙලා නැහැ. දැන් මෙහෙම වන්නේ ඇයි? කවුරු හරි අප අතරේ අවාසනාවන්තයෙක් උපත ලබා සිටිනවා ද?" සැඩොල් ප්‍රධානියා විමසුවා. එය සෙවීම සඳහා ඔහු උපායක් යෙදුවා.

පවුල් දහස පවුල් පන්සියයක් බැගින් දෙ කොටසක් කළා. සිටුවරයා පිළිසඳගත් කාන්තාව සිටි පවුල් පන්සියයට රැකියා අහිමි වුණා. අනෙක් පවුල් පන්සියයට රැකියා ලැබුණා. නැවතත් ඒ පවුල් පන්සියය පවුල් දෙසිය පනහ බැගින් වෙන් කළා. එහිදීත් අර කාන්තාව සිටි පවුල් දෙසිය පනහට රැකියා අහිමි වුණා. මේ ආකාරයට බෙදා ගෙන යද්දී ආනන්ද සිටුවරයා පිළිසිඳ ගත් ඒ කාන්තාවත්, ඇගේ සැමියාත් තනි වුණා. ඔවුන් දෙදෙනා සැඩොල් කුලයෙන් නෙරපා දැමුවා. සැමියා ද ඈ අතහැර දැමුවා.

දරුවා කුස දරා සිඟමන් ගිය ද ඇයට වෙනදා මෙන් කිසිදු දෙයක් ලැබුණේ නැහැ. බොහෝ දිනවල නිරාහාර ව කල්ගත කළා. ඇය ඉතා දුබල වුණා. අවසානයේ දී ඉතා අවාසනාවන්ත දරුවෙකු බිහි කළා. ඔහුගේ ඇස්, කන්, නාසා ඉතා විරූපි යි. ඔහු මිනිස් ලොව සිටිය දී කිසිදු පිනක් නො කළ බැවින්, ඔහු ඉතා අවලස්සන වුණා. විරූපි ප්‍රේතයෙක් වගේ දුටුවන් බියට පත්වෙන රූපයක් ලැබුණා. කෙ තරම් අවලස්සන වුව ද මව ඔහු පෝෂණය කළා. දරුවා කැටුව ගිය කිසිම දිනයක දී ඇයට සිඟමනක් ලැබුණේ නැහැ. දරුවා නිවසේ රඳවා ගිය දිනවල දී ඇය යමක් උපයා ගත්තා. දරුවාට ඇවිද ගන්නට පුළුවන් වයසට ආ විට ඇය පිඟානක් දරුවාගේ අතට දී "පුතේ නුඹ නිසා මා විඳි දුක් අපමණ යි. තවදුරටත් නුඹ රැක ගැනීම මට ඉතා අසීරු යි. ඒ නිසා නුඹ මේ නුවර සිඟා කා ජීවත් වෙන්න" කියා දරුවා තනිකර දමා ඇය පිටව ගියා.

දිනක් මේ දරුවා සිඟමනේ යද්දී ආනන්ද සිටුතුමා ජීවත් වූ මාළිගය පිහිටි ස්ථානයට ආවා. තමා මීට පෙර ජීවිතයේ ජීවත් වූ මාළිගය මේ යැයි මතකයට ආ දරුවා මැඳුරට පිවිසෙන වාසල් දොරවල් තුනක් පසුකර ඉදිරියට ගියා. සිටු මැඳුරේ වාසල් දොරටුව අසල දී මාළිගයේ දාසයන් එක් වී විරූපී කොලුවාට තළා පෙළා මහමඟ තිබූ කසළ ගොඩකට ඇද දැමුවා.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේ සමඟ ඒ සිටු මැඳුර අසලින් පිඬුසිඟා වඩිද්දී දරුවා සිටි ස්ථානයේ නතතර වූ සේක. බුදුන් වහන්සේ පුත්‍ර සිටුවරයා ඒ ස්ථානයට කැඳවූවා. අවට ජනතාව ද ඒ ස්ථානයට එක්රැස් වුණා. බුදුන් වහන්සේ වදාළා

"සිටුතුමනි, මේ කවුරුදැ කියා හඳුනනවා ද?"

"නැත ස්වාමිනි"

"සිටුතුමනි, මේ සිටින්නේ ඔබගේ පියාණන් වන ආනන්ද සිටුවරයායි" එවිට පුත්‍ර සිටුතුමා මහත් කළබලයට පත්ව බුදුන් වහන්සේට චෝදනා කරමින්,

"ස්වාමිනි, මගේ පියා මහා ධනයක් තිබූ කෙනෙක්. ඔහු මේ වගේ විරූපී දරුවෙක් වෙන්නේ කොහොම ද? ඔබ වහන්සේ කියන දේ මා කිසිසේත් පිළිගන්නේ නැහැ"

එවිට භාග්‍යවතුන් වහ්නසේ සැඩොල් දරුවා දෙසට හැරී "දරුව, ඔබ පෙර ආත්මයේ සඟවා තිබූ නිධාන පෙන්වන්න" කියා වදාළා. එවිට දරුවා වත්ත පහළට ගොස් වළ දමා තිබූ ඒ නිධානය පෙන්වූවා. ඒ අසල සිටි සියලු දෙනාම මේ සිටින්නේ ආනන්ද සිටුතුමා බව පිළිගත්තා. භාග්‍යවතුන් වහන්සේ සියලු දෙනාට ධර්මය දේශනා කළ සේක. සිටුතුමාගේ නුවණ මෝරා නො තිබුණ නිසා ඔහුට ධර්මය අවබෝධ කර ගැනීමට නො හැකි වුණා. නමුත් ඔහු තෙරුවන් සරණයෙහි පිහිටියා.

බුදුරජාණන් වහන්සේ වදාළා "අනුවණයෝ උපන් ලෝභයෙන් පීඩා විඳිනවා. දරුවෝ ද නැති වෙනවා. නුවණ ද නැති වෙනවා. ඊළඟ ජීවිතයේ ද ඔහු දරුවන් රකිනු පිණිස ද, ධනය රැස්කර ගැනීම පිණිස ද, රෑ දවල් මහා දුක් ගොඩක් විඳිනවා. එසේ දුක් විඳ අවසන මරණාසන්න ව යහනෙහි වැතිර සිටින විට මරණ වේදනාවෙන් ඇට, සන්ධි තුළින් අධික වේදනාවක් එනවිට දෑස වැසෙනවා. ඒ සමඟම පරලොවදී ඇස් ඇරෙනවා. ඒ ලෝකයේ තමා අවට තිබෙන දේ තමයි එවිට ඔහුට පෙනෙන්නේ. දිනකට තුන් වරක් නහවා, සුවඳ මල් පළඳවා තැබුවද තමාට තමා හෝ පිහිට නොවන ආකාරයටයි එදාට කරුණු යෙදෙන්නේ.


මේ ආනන්ද සිටුතුමා කිසිවෙකුට කිසිවක් නො දී දරුවන් සඳහා යැයි කියමින් ධනය රැස් කළා. ඒ භවයේ මරණාසන්න ව සිටිද්දීත්, දැන් මෙසේ විරූපී ව දුකට පත්වෙලා සිටිද්දීත් ඔහුට දරුවන්ගෙන් පිහිටක් නැහැ. වස්තුවෙන් ද පිහිටක් නැහැ. වස්තුව ඇති තැනැත්තා ඒ වස්තුව තමාගේ යහපත වෙනුවෙන් යොදගත යුතුයැයි" වදාළ සේක.

මනුෂ්‍යයෝ යම් ක්‍රියාවක් කොට අනේ අප කළේ කුමක්දැයි පසුතැවිලි වෙනවානම්, කළා වූ අකුසලයේ විපාක හඬ හඬා විඳිනවා නම්, ජීවිතය අහිමි වුවත්, එවනි පව්නම් නො කර සිටිය යුතුයැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

සියලු දෙනා සතුටින් ඒ ධර්මය අසා මාර්ගඵල උපදවා ගත්තා. දරුවන් කෙරෙහිත්, ධනය කෙරෙහිත් ඇති ආශාව අතහැර දැමුවා.

නයනා නිල්මිණී

# පිරුවානා පොත් වහන්සේ



**'චතුභාණවාර පාළි' නාමයෙන් හඳුන්වා ඇති ග්‍රන්ථය ලංකාවේ දී 'පිරුවානා පොත් වහන්සේ' නාමයෙන් සම්භාවනාවට පත් විය. පෙර මහා විහාරීය මහ තෙරුන් වහන්සේලා විසින් සත්වයන්ට අනුග්‍රහ පිණිස (සත්තානං අනුග්ගහාය), භය නැසීම පිණිස (භයානං පටිඝාතාය), ලොමු ඩැහැ ගැනීම් ප්‍රහානය කරනු පිණිස (ලෝමහංසානං පහාණාය), නොයෙක් නොයෙක් රෝග, ව්‍යාධි ආදී ව්‍යසන වනසනු පිණිස (නානාව්‍යාධීනං විනාසාය), අප තථාගතයන් වහන්සේ විසින් මහා කරුණාවෙන් දේශනා කරන ලද නොයෙකුත් සූත්‍රයන් අතුරින් සත්වයන් භයාදී නේක විපත්තිවලින් හාත්පසින් ම ආරක්ෂා කරන බැවින් 'පරිත්ත' නාමයෙන් සුවිශේෂී ව නම් කරන ලද සූත්‍ර ඒ ඒ නිකායයෙන් උපුටාගෙන මෙම 'චතුභාණවාර පාළි'ය සකස් කරන ලද බව පිළිගත් මතයයි.**

**අවිදු අඳුර දුරලා සිවුසස් දහම් අවබෝධ කළ නිසා අප තථාගතයන් වහන්සේට 'නමෝ' යැයි කියා වන්දනා කරන ලද්දේ සාතාගිර නමැති යක්ෂ සෙන්පතියා විසිනි**

**පළමුව සධාතුක කරඬුව ද, දෙවනුව පිරුවානා පොත් වහන්සේ ද, තෙවනුව මහා සංඝ රත්නය ද වැඩමවනුයේ පුරාණ චාරිත්‍රයක් අනුව ය**



දර්ශනපති රාජකීය පණ්ඩිත
ත්‍රිපිටකාචාර්ය
නිහිළුවසිරි ධම්මානන්ද මහ පිරිවෙන්පති
**හත්තොටුවේ ඉන්දරතන හිමි**

ඇතැමෙක් මෙම 'චතුභාණවාර පාළිය' අප සිංහල දීපප්‍රසාදක අතිපූජනීය මිහිඳු මහ රහතන් වහන්සේ විසින් හෝ මහා අටුවාචාර්ය භදන්ත බුද්ධඝෝෂාචාර්යපාදයන් විසින් ලංකාවට ගෙනා බව පවසති. කවරෙක් කවදා කොතැනදී 'චතුභාණවාර පාළි'ය සංග්‍රහ කරන ලද දැයි ස්ථිරව කිව නොහැක. 'චතුභාණවාර පාළි අට්ඨකථාව' කලිකාල සාහිත්‍ය පණ්ඩිත, පරාක්‍රමබාහු රජදවස අතිපූජ්‍ය අනෝමදස්සි සංඝරාජයන් වහන්සේගේ අනුමැතියෙන් අති පූජනීය ආනන්ද වනරතන මහ තෙරුන් වහන්සේගේ ශිෂ්‍ය වූ බහුශ්‍රැත මහ තෙරනමක් විසින් ලියන ලදී. කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස අති ගෞරවාර්හ අසරණ සරණ සරණංකර සංඝරාජ මා හිමිපාණන් වහන්සේ විසින් චතුභාණවාර පාළියට සිංහල ව්‍යාඛ්‍යානයක් සපයන ලදී.

**'අට්ඨක්ඛරා ඒකපදං**
**ඒකා ගාථා චතුප්පදා**
**ගාථා චේකා මතෝ ගන්ථෝ**
**ගන්ථෝ බත්තිංසතක්ඛරෝ'**

අකුරු අටක් එක පදයකි. (පාදයකි.) පාද සතරක් එක ගාථාවකි. එක ගාථාවක් එක් ග්‍රන්ථයකි. (ගාථාවක් යනු ග්‍රන්ථයකි.) එවිට එක් ග්‍රන්ථයක අකුරු තිස්දෙකකි.

**'බත්තිංසක්ඛර ගන්ථානං**
**පඤ්ඤසං ද්විසතං පන**
**භාණවාරෝ මතෝ එකෝ**
**අට්ඨක්ඛර සහස්සකෝ' ති.**

(චතුභාණවාර පාළි–හේවාවි.–1956–2 පිටුව)

අකුරු දෙතිස බැගින් වූ ගාථා දෙසීය පනහක් එක් බණවරකි. එවිට එක් බණවරකට අකුරු අටදාහකි. එවැනි අක්ෂර අටදාහ (8,000) බැගින් වූ බණවර සතරක් චතුභාණවාර පාළියේ ඇත. පිරුවානා පොත් වහන්සේ තුළ ඇතුළත් බණවර සතරෙහි අක්ෂර තිස් දෙදාහක් (32,000) ඇත.

අප තථාගතයන් වහන්සේගේ සිරිපා පහස තෙවරක් ලද උතුම් ශ්‍රී ලංකාද්වීපයේ 'වහන්සේ' නාමයෙන් ගරු ප්‍රසාදයට පත් ගෞරවණීය ග්‍රන්ථ දෙකකි. ජාතක පොත් වහන්සේ හා පිරුවානා පොත් වහන්සේ ය.

සිරිලක් වැසියන්ට සමාජ අත්දැකීම් ලබාදී, ඔවුන්ගේ චරිත සංවර්ධනය සිදු කරවන ලද්දේ ජාතක පොතෙනි. රෝග, අමනුෂ්‍ය, දුර්භික්ෂාදියෙන් ඔවුන්ට සුරක්ෂිත රැකවරණය හාත්පසින් ම සලසා දෙන ලද්දේ පිරුවානා පොත් වහන්සේ මගිනි. පිරිත් පොත තනිවම වඩමවනු නොලබයි. පිරිත් පොත වැඩමවීමට පෙර සධාතුක කරඬුන් වහන්සේ වැඩම කරවීම සිංහල බෞද්ධයන්ගේ පුරාණ චාරිත්‍රයයි. පළමුව සධාතුක කරඬුව ද, දෙවනුව පිරුවානා පොත් වහන්සේ ද, තෙවනුව මහා සංඝරත්නය ද වැඩමවනුයේ පුදුමාකාර ගෞරවයකිනි. අතිශය ශ්‍රද්ධාවකිනි. පිරුවානා පොත් වහන්සේ හෙවත් චතුභාණවාර පාළිය රචනා වී ඇත්තේ පාලි භාෂාවෙනි. එහි ඇතුළත් පාලි පාඨයන්ගේ අර්ථ දැන ගැනීම සිවුවනක් පිරිසට ම අත්‍යවශ්‍යවූවකි. එනිසා පිරුවානා පොත් වහන්සේ තුළ අන්තර්ගත පාලි පාඨයන්ගේ අර්ථ අපගේ ශක්ති ප්‍රමාණයෙන් විමසා බැලීම කාලෝචිත ය.

**පිරිත් පොතේ ඇතුළත් පළමු බණවරෙහි ධර්ම කොට්ඨාස දහසයකි.**

ඒවායින් සරණාගමන, දසසික්ඛාපද, සාමණේර පඤ්හ, ද්වත්තිංසාකාර, මංගල සුත්ත, රතන සුත්ත, කරණීයමෙත්ත සුත්ත යන ධර්ම කොටස් හත බුද්දක නිකායෙන් උපුටාගෙන ඇත. පච්චවෙක්ඛණා, දසධම්ම සුත්ත, ඛන්ධ පරිත්ත, මෙත්තානිසංස සුත්ත යන ධර්ම කොටස් හතර අංගුත්තර නිකායෙන් උපුටා ගන්නා ලදී. මිත්තානිසංස සූත්‍රය, මෝර පරිත්තය යන සූත්‍ර දෙක ජාතක පාළියෙන් ගන්නා ලදී. සංයුත්ත නිකායෙන් ගත් සූත්‍ර වශයෙන් චන්ද පරිත්ත, සූරිය පරිත්ත, ධජග්ග පරිත්ත යන සූත්‍ර තුන සැලකේ.

**දෙවැනි බණවරෙහි ධර්ම කොට්ඨාස පහකි.**

ඒවායින් මහාකස්සපත්ථෙර බොජ්ඣංග සූත්‍රය, මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග සූත්‍රය, මහා චුන්දත්ථෙර බොජ්ඣංග සූත්‍රය යන සූත්‍ර තුන සංයුත්ත නිකායෙනුත්, ගිරිමානන්ද සූත්‍රය අංගුත්තර නිකායෙනුත්, ඉසිගිලි සූත්‍රය මජ්ඣිම නිකායෙනුත් උපුටාගන්නා ලදී.

**ඉන් අනතුරුව දැක්වෙනුයේ සූත්‍ර හතකි.** ඉන් ධම්මචක්කප්පවත්තන සූත්‍රය සංයුත්ත නිකායෙනුත්, මහාසමය සූත්‍රය දීඝ කායෙනුත්, පරාභව සුත්ත, ආලවක සුත්ත, වසල සුත්ත, කසීභාරද්වාජ සුත්ත යන සූත්‍ර හතර බුද්දක නිකායෙනුත් අවසානයට ඇති සච්චවිභංග සූත්‍රය මජ්ඣිම නිකායෙනුත් උපුටාගෙන ඇත.

**තෙවැනි බණවරෙහි හා සිවුවැනි බණවරෙහි** ඇතුළත් ආටානාටිය සූත්‍ර දෙක දීඝ නිකායෙන් ගන්නා ලද ධර්ම කොට්ඨාසයන් ය. ඒ අනුව අප නිරන්තරයෙන් භාවිත කරන පිරුවානා පොත් වහන්සේ තුළ අන්තර්ගත සූත්‍ර ධර්ම කොට්ඨාස සියල්ල තිහකි. දැන් අප ඒ කොටස් එකිනෙකගෙන අරුත් විමසා බලමු.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ**
**සම්මා සම්බුද්ධස්ස.**
**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා**
**සම්බුදුරජාණන් වහන්සේට**
**නමස්කාර වේවා.**

පළමුව දැක්වෙනුයේ නමස්කාරය යි. එහි 'අවිදු අඳුර දුරලා සිවුසස් දහම් (චතුරාර්ය සත්‍ය ධර්මය) අවබෝධ කළ නිසා' අප තථාගතයන් වහන්සේට '**නමෝ**' යැයි කියා වන්දනා කරන ලද්දේ සාතාගිර නැමති යක්ෂ සෙන්පතියා විසිනි. 'තෘෂ්ණා මානාදී සියලු ම කෙලෙස් ධර්මයන් මුලිනුපුටා දැමූ නිසා' අප අමාමෑණියන් වහන්සේට '**තස්ස**' යැයි කියා නමස්කාර කරන ලද්දේ වේපචිත්ති අසුර සෙන්පතියා විසිනි. 'සියලු රාගාදී කෙලෙස් ධර්මයන් නසා භග ධර්මයන්ගෙන් පිරිපුන් වූ නිසා' අප භාග්‍යවතුන් වහන්සේට '**භගවතෝ**' යැයි කියා නමස්කාර කරන ලද්දේ සිවුවරම් රජදරුවන් විසිනි. 'දෙව් මිනිසුන්ගේ සිවුපස ලාභය ලැබීමට සුදුසු එකම අසහාය උතුමන් වහන්සේ වන නිසා' තථාගතයන් වහන්සේට '**අරහතෝ**' යැයි කියා නමස්කාර කරන ලද්දේ දෙ දෙව් ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයා විසිනි. 'සිවුසස් දහම හෙවත් චතුරාර්ය සත්‍ය ධර්මය තමන් වහන්සේ තනිව ම අවබෝධ කරගත් නිසා' බුදුපියාණන් වහන්සේට '**සම්මා සම්බුද්ධස්ස**' යැයි කියා නමස්කාර කරන ලද්දේ සහම්පතී මහා බ්‍රහ්මයා විසිනි.

**මෙම ලිපියේ ඉතිරි කොටස තිකිණි පුර අටවක (25) පුවත් පතේ පළවේ.**

Part 03

# Virtues of a noble life

**It is important to have a favourable environment for *bhavana* both internally and externally to achieve progress. As the initial step of *bhavana*. One has to prepare ones mind by establishing certain virtues. It gives self confidence to the participant who feels strength and energy through the purity of mind, body and word. The preservation of the purity of mind, body and word is achieved by keeping eight virtues that are known as "*agievaashtaka sila*". It means the virtues of a noble life.**



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

**Refrain from killing.**
**Refrain from taking that which is not given.**
**Refrain from wrongful sex.**
**Refrain from telling lies.**
**Refrain from useless chat such as gossip.**
**Refrain from harsh words.**
**Refrain from getting into meaningless conversation.**
**Refrain from wrongful way of life.**

When one observes the above virtues, one's mind achieves a high degree of purity and begins to feel the joy. That is the most favourable state to commence *bhavana*.

*Bhavana for the Mind Full of Lust*

When one's mind is dominated by lust, one may find it difficult to control the mind. This mind craves and chases after sensual desire for satisfaction and gets trapped into any object of lust. It tends to think that this object is more attractive than the previous one and so on leading to confusion. There is a high degree of anticipation towards the association with objects of opposite sex. In such a mind, thoughts of lust and craving surface faster and suppress thoughts of loving kindness and mettha. Thus, for individuals with a lustful mind there are two methods of *bhavana*.

1. *Bhavana* on ten objects of impurity
2. *Bhavana* on body parts

*Bhavana on Objects of Impurity*

In this method, various stages of the dead body serve as Bhavana objects. Samadhi (concentration) is achieved by focusing the mind on these objects. The details of this are to follow in a later segment of this brochure.

*Kayaggatha Sati Bhavana (meditation on body parts)*

The Buddha described the body in 32 different parts. By focusing the mind on all these 32 body parts gradually, one can develop Samadhi according to the Teaching. Following are the 32 parts as indicated in the Pali Cannon.

| | |
|---|---|
| 1. Hair of the head | 17. Mesentery |
| 2.. Hair of the body | 18. Stomach |
| 3. Nails | 19. Excrement |
| 4. Teeth | 20. Brain |
| 5. Skin | 21. Bile |
| 6. Flesh | 22. Phlegm |
| 7. Sinuses | 23. Pus |
| 8. Bones | 24. Blood |
| 9. Marrow | 25. Sweat |
| 10. Kidneys | 26. Lymph |
| 11. Heart. | 27. Tears |
| 12. Liver | 28. Serum |
| 13. Diaphragm | 29. Saliva |
| 14. Spleen | 30. Nasal mucus |
| 15. Lungs | 31. Synovial fluid |
| 16. Intestines | 32. Urine |

# දුප්පත් ද පොහොසත් ද?

**මේ ලෝකයේ සිටින පිරිස් දුප්පත් පොහොසත් කියා ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකි ය. ඒවා ද වඩාත් ම දුප්පත්, ටිකක් දුප්පත්, වඩාත් ම පොහොසත්, ටිකක් පොහොසත් කියා තව තවත් කොටස්වලට වර්ග කළ හැකි ය.**

ඔබ මේ කොටස්වලින් කුමන කොටසට අයත් ද? බොහෝ දෙනෙකු සිතන්නේ අනේ මම දුප්පත් කෙනෙක් කියලයි. ඒ ඔබ සිතන ආකාරයයි. ඔබට ඇති දේ ගැන මොහොතක් සිතා බලන්න. ඔබට නැති දේ ගැන මොහොතක් සිතා බලන්න.

මෙහෙම කිව්වම මට නැවක් නැහැ. ගුවන් යානයක් නැහැ. තේ වත්තක් නැහැ. පොල්වතු නැහැ. ආදී වශයෙන් නැති බොහෝ දේ කිව හැකි ය. එසේ නොව මිනිසෙකු වශයෙන් ඉපදී මිය යන්නේ නැතිව ජීවිතය ගෙවීමට මට මොනවා ද? අවශ්‍ය කියා සිතන්න. නොමැරී ජීවිතය ගෙවීමට අවශ්‍ය කරන දේවල් අතර මට නැත්තේ මොනවාද? අඳින්න ඇඳුමක්, කන්න ආහාර, නිදන්න තැනක්, මේ ආදී වශයෙන් ඔබට ජීවත්වීමට අවශ්‍ය මූලික දේ ඇත්නම් ඔබ දුප්පතෙක් කියා මොහොතකටවත් නො සිතන්න.



ශාස්ත්‍රපති , රාජකීය පණ්ඩිත
**කොටනෙළුවේ පුඤ්ඤදනන්ද හිමි**

මේ ලෝකයේ රුවෙන විට නිදගන්න තැනක් සොයන මිනිසුන් කොපමණ සිටිනවා ද? කුස පිරෙන්න ආහාරයක් නැතිව බඩගින්නේ දුක්විඳින මිනිසුන් කොපමණ සිටිනවා ද? ආසාවට බීම වීදුරුවක් බොන්න, රස කැවිලි කන්න කෙළ ගිලිමින් සිටින අය කොච්චර ද? ලස්සන ඇඳුමක් අඳින්න ආසාවෙන් අන් අයගේ ඇඳුම් දෙස බලමින් සතුටුවෙන අය කොපමණ සිටිනවා ද? අන් අය පාරේ ගමන් කරන වාහන දෙස බලමින් එම වාහනයක් ගැනීමට නොව එක දවසක් රවුමක් හරි යන්න ආසාවෙන් සිටින අය කොච්චර ද කියා ඔබ දන්නවා ද? ඇත්තට ම මෙවැනි ලෝකයක අපි ජීවත් වෙමු.

සමහරු බොහෝ සැප විඳිති. තවත් අය දුක් විඳිති. මේ පව පින අතර වෙනස නොවේ ද? ඔබ කිසිවිටෙකත් දුප්පත් කියා නොසිතන්න. තිබෙන දේ ගැන සිතා සතුටුවෙන්න. නැති දේ ගැන නොසිතන්න. ආශාවන් අඩු කරගන්න. සරල හා අල්පේච්ඡ ජීවිතයක් ගැන සිතන්න. ඔබට සතුට ලැබෙයි.

# සම්මා සම්බුද්ධත්වයට උපකාර වූ බෝධීන් වහන්සේ






### කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ සල්කලන බෝධිය

**සාල කල්‍යාණිකො බෝධි කොණ්ඩඤ්ඤස්ස මහසිනො**

යනුවෙන් බුද්ධ වංශයෙහි 66 වන පිටුවෙහි ඇතුළත් ගාථා පාඨයෙන් ඒ බව තවදුරටත් තහවුරු වේ.

### මංගල බුදුරජාණන් වහන්සේ නා බෝධිය

**බෝධිතස්ස භගවතො නාගරුක්ඛෝති වුච්චති**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය නාග වෘක්ෂය යැයි කියනු ලැබේ. යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි 74 වන පිටුවෙහි සඳහන් වේ.

### සුමන බුදුරජාණන් වහන්සේ නා බෝධිය

**සෝපි බුද්ධෝ අමිතත යසෝ නාගමූලේ අබුජ්ඣථ**

අප්‍රමාණ වූ යසස් ඇති ඒ බුදුහුදු නාග වෘක්ෂයෙහි බුද්ධත්වයට පැමිණියහ. යනුවෙන් බුද්ධ වංශයෙහි 82 වන පිටුවෙහි සඳහන් ගාථා පාඨයෙන් ඒ බව ප්‍රකට වේ.

### රේවත බුදුරජාණන් වහන්සේ නා බෝධිය

**සෝපි බුද්ධෝ අසමසමෝ නාගමූලේ අබුජ්ඣථ**

යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි සඳහන් වේ. අසමසම වූ ඒ බුදුරජාණන් වහන්සේ නාග වෘක්ෂ මූලයෙහි දී අධිගම කළහ. යනුවෙන් බුද්ධ ජයන්තියේ පරිවර්තනය කර ඇත.

### සෝභිත බුදුරජාණන් වහන්සේ – නා බෝධිය

**බුජ්ඣමානෝ ච සෝ බුද්ධෝ නාග මූලේ අබුජ්ඣථ**

යනුවෙන් ඒ බුදුරජාණන් වහන්සේ සත්‍යවබෝධ කරන්නාහු නාග වෘක්ෂය මූලයෙහි බුද්ධත්වයට පත් වූ බව බුද්ධ වංශ පාලියේ 96 වන පිටුවේ ඇතුළත් වේ.

### අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ – කුඹුක් බෝධිය

**බෝධි තස්ස භගවතෝ අජ්ජුනෝති පවුච්චති**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය අර්ජුන (කුඹුක්) යැයි කියනු ලැබේ. යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි 106 පිටුවෙහි සඳහන් වේ.

### පදුම බුදුරජාණන් වහන්සේ – මහාසෝණ බෝධිය

**බෝධි තස්ස භගවතෝ මහාසෝණොති වුච්චති**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය මහාසෝණ යැයි කියනු ලැබේ. සද්ධර්මාලංකාරයෙහි අභිනීහාර වර්ගයේ මහමුරුත බෝධීන් වහන්සේ කරා එළඹ අට තිස් රියන් තණ ඇතිරියෙහි වැඩ හිඳ කෙලෙසුන් සිඳ බුදු වූ බව සඳහන් වේ. සද්ධර්මාලංකාරයෙහි මහාසෝණ යන වචනය මහා මුරුත යනුවෙන් පරිවර්තනය කොට ඇත. ඉන්පසු රචනා වූ සද්ධර්මරත්නාවලියෙහි මේ බෝධීන් වහන්සේ උණ බෝධිය වශයෙන් සඳහන් කරයි. එනම් "ඔබට බෝධිය වූයේ උණ ගස් ය". යන පාඨයෙන් ඒ බව තහවුරු වේ.

### නාරද බුදුරජාණන් වහන්සේ – මහා සෝණ බෝධිය

**බෝධි තස්ස භගවතෝ මහාසෝනොති වුච්චති**

සද්ධර්මාලංකාරයෙහි සුළු මුරුත බෝ මුල්හි යනුවෙන් ද, සද්ධර්මරත්නාවලියෙහි බෝධි වූයේ මුරුත ගසකැ යනුවෙන් ද අන්තර්ගත වේ.

නාරද බුදුරජාණන් වහන්සේගේ පිටදුන් බෝධිය මහාසෝණ බෝධිය යනුවෙන් ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ බුද්ධ වංශයෙහි සඳහන් වේ. එය ඉහත සඳහන් කළ පරිදි සද්ධර්මාලංකාරයේත්, සද්ධර්මරත්නාවලියේත් මහ මුරුත යනුවෙන් ද පරිවර්තනය කොට ඇත.

### පදුමුත්තර බුදුරජාණන් වහන්සේ – සලල බෝධිය (සල් බෝධිය)

**බෝධි තස්ස භගවතෝ සලලෝති පවුච්චති**


ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය සලල යැයි කියනු ලැබේ. සද්ධර්මරත්නාවලියෙහි පියුම තුරා බුදුරජාණන් වහන්සේ වශයෙන් විස්තර කොට ඇත්තේ මෙම බුදුරජාණන් වහන්සේ ය. පදුමුත්තර යන පාලි වචනය සද්ධර්මරත්නාවලියෙහි පියුමතුරා යනුවෙන් සිංහලට බිඳගත් ආකාරය සඳහන් ය.

**හේමමාලා රන්දුනු**

## ප්‍රහේලිකා අංක 14

බුදුසරණ | ත්‍යාග අනුග්‍රහය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**




**හරහට**

1. තම රූ සපුව ගැන මානයෙන් බුදුරදුන් ඉදිරියට යාමට මැලි වූ කුමරියයි.
5. දයකයින් මාසික ව ගමේ විහාරස්ථානයට පුදනු ලබන දනය මෙනමින් හැඳින්වෙයි.
6. ගමේ බෞද්ධයින් පුදපූජා සඳහා රැස්වන මධ්‍යස්ථානයයි.
7. හින්දු ආගමේ සඳහන්වන ප්‍රධාන දෙවිකෙනෙකුගේ නමයි
9. ආයුර්වේදයෙහි එන දියර ප්‍රතිකාරකයකි.
11. බුදුන් වහන්සේ සුර අසුර යුද්ධය ගැන මෙම සූත්‍රයෙහි දී සඳහන්කර වදරති.

**පහළට**

2. තම රූ සපුව ගැන පලකළ මතය ගැන මෙම බමුණු දියණිය බුදුරදුන් කෙරෙහි වෛර බැඳගත්තා ය.
3. රජ මැදුරට යෙදෙන නමකි.
4. බුද්ධාදී අටතැනක් ගැන මෙවන් සිතිවිලි ඇතිවීම ද නීවරණයකි.
8. "පරිච්ඡේද" යන්න සඳහා භාවිත කරන තවත් නමකි.
9. දගැබක බිම් මට්ටමේ ඇති වළලු තුන මෙනමින් හැඳින්වෙයි.
10. අකුසල්වල විපාක වශයෙන් නිරයෙහි දී මේවා විඳින්නට සිදුවෙයි.

**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

**නිකිණි අමාවක 2020.08.18**

## ආදර්ශවත් නායකත්වය

කකුළු මව ගමන් යන්නේ ඇදට ය. තමන් ඇදට ගිය ද ඇයට වුවමනා තම දරුවන් කෙළින් ගමන් කරනවා දැකීමට ය. එහෙයින් ඇය ඉදිරියෙන් යමින් දරුවන්ට තමන් අනුව එන ලෙස අවවාද කරයි. දරුවන් ද ඇය ම අනුකරණය කරයි. ඇදට ම යයි.

සත්ව චරිත ඇසුරින් නිර්මාණය වූ ජන වහරේ ප්‍රචලිත මෙවන් කියමන් ආවාට ගියාට නිර්මාණය වූ දේ නොවේ. අවවාදයට වඩා ආදර්ශය උතුම් ය යන කියමන් සිහි ගන්වන මෙවැනි කතා මිනිස් සමාජයට දෙන්නේ ඉතා වටිනා පණිවිඩයකි.

මිනිසා සහජයෙන් ම අනුකරණයෙහි දක්ෂ ය. මෙලොව එළිය දකින මිනිස් දරුවා පළමුව අනුකරණය කරන්නේ මව්පියන් ය. ජීවිතයට උකහා ගන්නේ ඔවුන්ගේ ඇවතුම් පැවතුම් ය. මෙසේ පවුල තුළින් පටන් ගන්නා අනුකරණය පාසල, පන්සල, ගම, රට ආදී ලෙස පොදු සමාජය දක්වා වර්ධනය වේ. රටක් ගමන් කරන අත තීරණය කරන්නට එය ප්‍රබල සාධකයකි.

රාජ්‍ය නායකත්වය සමස්ත රට වැසියාට ම බලපාන චරිතයකි. අප තථාගතයන් වහන්සේ සතර අගතියෙන් තොරවීම, දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානිය ධර්ම රාජ්‍ය නායකත්වයට නිර්දේශ කොට වදාළේ එහෙයිනි.

රටක ආගම දහම සුරක්ෂිත වන්නේ, ජනතාව සුරක්ෂිත වන්නේ, ගහකොළ ඇතුළු පරිසරය සුරක්ෂිත වන්නේ සරලව කියනවා නම්, සමස්ත සත්ව ප්‍රජාවගේ ම ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත වන්නේ, රටේ සෞභාග්‍යවත් අනාගතය තීරණය වන්නේ රජුගේ ආදර්ශ සම්පන්න නායකත්වයේ ස්වභාවය අනුව ය. එවැනි නායකත්වයක් ඇති රටක් සැබැවින් ම භාග්‍යවන්ත ය.

එවන් භාග්‍යවන්ත දේශයකට දැන් අරුණෝ ලෝකය උදාවී තිබේ.

පසුගියදා මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමන්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ඉදිරියේ මේ රටේ නව අග්‍රාමාත්‍යවරයා ලෙස දිව්රුම් දුන් අවස්ථාවේ ජනාධිපතිතුමා විසින් අග්‍රාමාත්‍යතුමාට වැඳ ආශිර්වාද ලබා ගැනීම මෙරට බොදු ජනතාවගේ සිත් සංවේදී කිරීමටත්, අතිශය සතුටට පත් කිරීමටත් සමත් විය. සම්බුදු දහම සහෝදර බැඳීම ඉහළින් අගය යි. මවට, පියාට , සහෝදර, සහෝදරියන්ට ගෞරව කරන්නා ම ය, සමාජයේ අන්‍යයන්ට ද ගෞරව වන ලෙස හැසිරෙනුයේ. අන්‍යයන් ගේ සුරක්ෂිත බව වෙනුවෙන් කැප වනුයේ. ජනාධිපති තනතුර කුමන තරම් ඉහළ වුව ද, අවස්ථාව කුමක් වුවද සිය වැඩිමහල් සහෝදරයාට ගරු කරන්නට හෙතෙම පසුබට වූයේ නැත. එය සමස්ත බොදු ජනතාව ම අගයන්නකි. එමෙන් ම ලාංකේයයන්ට පමණක් නොව ලෝකයටම ආදර්ශයකි.

කතාවට නොව ක්‍රියාවට මුල්තැන දීම යහපත් රාජ්‍ය නායකත්වයක සුබ ලකුණු ය. කොරෝනා උවදුර ලෝකයක් බිලි ගනිද්දී ශ්‍රී ලාංකේයයන් ලෙස අපේ ජීවිත සුරක්ෂිත වූයේ, මත් උවදුරෙන් රට මුදවා ගනුවස් ජාවාරම්කරුවන් නීතියේ රැහැනට හසුවන්නේ, සැගවී සිටින අපරාධකරුවන් නීතියේ රැහැනට හසු වන්නේ, දේශීයත්වය අගය කරමින් මුඩු බිම් සරු කෙත් බවට පත්වන්නේ, බිම් අඟලේත් මිරිස් පැළයක් හෝ වැවෙන්නේත් ඒ ආදර්ශයේ මහිමයෙනි.

මත් උවදුරෙන් තොර, අපරාධයන්ගෙන් තොර , ස්වයංපෝෂිත රටක් උදාවනු දැක්ම අප සැමගේ ප්‍රාර්ථනාව ය . රට තුළ සියලු ආගම් සුරක්ෂිත වන්නේ සම්බුදු දහම රැකුණේ නම් ය. උතුම් ත්‍රිවිධ රත්නයට ගරු කරන නායකත්වයක් කිසි දිනෙක රටට ජනතාවට අයහපතක් සිදු කරන්නේ නැත. බෞද්ධයන් ලෙස අපට ඒ භාග්‍යය උදා වී තිබේ.

අප කළ යුතු ඒ සෞභාග්‍යවත් දේශය ගොඩනැඟීමේ ගමනට රාජ්‍ය නායකත්වයට ශක්තිය ධෛර්ය ලබා දීම ය.



# දුර බලන්න

> අනුතප්පති යනු පසුතැවිලි වීම ය. කළ කම් ගැන සිතා දුක්වීම ය. පසුතැවුල මිනිසාගේ සැපය නැති කොට කයෙහි නොයෙක් වේදනා ඇති කරයි. ඒ අනුව සිතා බලා යමක් කිරීම වැඩදායක ය.

**විවිධ අයුරින් ක්‍රියා කොට පසුවට ඒ ගැන සිතා පසුතැවිලි වීම, දුක්වීම, කනගාටුවට පත්වීම සුලභ ව සිදුවන්නකි. අප ජීවත්ව න සමාජය තුළ කරන ක්‍රියා කොටස් දෙකකින් යුක්ත ය. එනම් හොඳ ක්‍රියා හා නරක ක්‍රියා යි. එයින් පසුතැවිල්ලට හේතු වන්නේ නරක ක්‍රියා යි.**

බුදුදහමට අනුව ඒවා අකුසල්, පව් ආදී වශයෙන් හැඳින්වේ. ධම්ම පදයේ බාල වග්ගය තුළ සඳහන් අට වෙනි ගාථාව මේ සම්බන්ධව ඉතා වැදගත් වේ. එනම්

**නතං කම්මං කතං සාධු**
**යං කත්වා අනුතප්පති**
**යස්ස අස්සුමුඛෝ රෝදං**
**විපාකං පටි සේවති**

යම් කර්මයක් කොට පසුතැවේ ද, යම් කර්මයක් විපාකය කඳුළින් වැකුණු මුහුණු ඇතිව හඬමින් විඳී ද, එවැනි කර්මයන් නො කර සිටීම මැනවි.

ඇත්තෙන්ම බොහෝ අය ආවේගශීලි වී හෝ, කෝපයෙන් හෝ පළිගැනීම් මාත්‍රයෙන් හෝ විවිධ ක්‍රියා සිදු කරති. දුරදිග නො බලා ක්ෂණික හැඟීම් මත යම් යම් සිදු කරති. නමුදු පසුවට ඒ ගැන සිතීමේ දී ඒ ගැන දුක්වීමට සිදු වේ. තමාටත් අවැඩ, අනුන්ටත් අවැඩ මෙලොවටත් අවැඩ, පරලොවටත් අවැඩ දෙයක්නම් එය දුක් සහගත ව විඳගැනීමට සිදුවේ.



රත්මලේ රතනසෙල
මහ පිරිවෙනෙහි
නියෝජ්‍ය පරිවේණාධිපති
**ගලගෙදර**
**රතනවංස හිමි**

ඉහත ගාථාව තුළ ඇති පද විවරණය දෙස බැලීමේ දී තවදුරටත් ඒ බව පැහැදිලි වේ. 'න සාදු' නම් යහපත පිණිස නො පවත්නා බව ය. පසුතැවිල්ලට හේතුවන දේ සිදු කොට අපායෙහි ඉපිද දරුණු දුක් විඳීමට හේතුවන පවුකිරීම ඉතා නොහබනා බව දක්වා ඇත. අනුතප්පති යනු පසුතැවිලි වීම ය. කළ කම් ගැන සිතා දුක්වීම ය. පසුතැවුල මිනිසාගේ සැපය නැති කොට කයෙහි නොයෙක් වේදනා ඇති කරන්නෙකි. ඒ අනුව සිතා බලා යමක් කිරීම වැඩදායක ය. පිරික්සා බලන විට කරන දැයෙහි විපාකය (හොඳ – නො හොඳ) වැටහෙන බව ඉන් පැහැදිලි වේ.

මෙලොවදී කරන පින්කම්වලට විපාකය, මෙලොව පල නුදුනත් බොහෝ සෙයින් පරලොව දී පලදීම නිසැක ය. මෙහිදි පසුතැවීමට හේතු වන්නේ ති දෙර හරහා එනම් සිත,කය, වචනය තුළින් සිදුවන අකුසල කර්මන් සමඟ ය. ඒවාට අප දස අකුසල් කියා කියනු ඇත. එනම් ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිත්‍යාචාර, මුසාවාද, පිශුනාවාචා, පරුෂාවාචා සම්ඵප්පලාපා, අභිධ්‍යා, ව්‍යාපාද, මිත්‍යාදෘෂ්ඨී වශයෙනි.

යමෙක් නරක සිතින් නරක දෙයක් කරන්නේ නම්, එම ක්‍රියාව පසුතැවීමට හේතුවන අකුසලයකි. එහිදී විශේෂයෙන් මනස තුළ හටගන්නේ ලෝභ, දෝෂ, මෝහ නම් වූ ත්‍රිවිධ අකුසල මූලයන් ය. එවැනි සිතක් ඇතිව කරන අයහපත් දෙය තුළ ඵලය වන්නේ "චක්කං ව වහතෝ පදං" යන විග්‍රහයට අනුව ගොනා පසුපස එන ගැල මෙනි. ඒ අනුව ක්ෂණික ව විපාක නො ලැබුණත් කළ අකුසලයන්හි විපාක අපට එන බැව් බාල වග්ගය තුළ පැහැදිලි වේ.

කිරි දෙවූ කෙණෙහි ම නො මිදේ. කිරි මිදවීමට උණු කර ගත් කිරට මෝරු ආදී මුහුන් දැමිය යුතු වේ. එවිට කිරි මිදේ. එපරිද්දෙන් පාප කර්මය කළ විගසම විපාක දෙන්නේ නොවේ.

එනමුදු ක්ෂණික ව විපාක නො දෙන්නේ යැයි සිතා දස අකුසල් කිරීම පසුවට දුක් විඳීමට හේතු වන්නකි. දීඝිති කෝසල ජාතකය තුළ සඳහන් වන්නේ "දීඝං වා මා රස්ස" දුර බලන්න ළඟ නො බලන්න යනුවෙනි. උසස් මනසක් ලැබූවන් වශයෙන් මිනිස් වර්ගයා විසින් ක්ෂණික තීරණ නො ගෙන බුද්ධිමත් ව සිතා බලා කටයුතු කළ යුතු ය.

අද බොහෝදුරට සමාජය ප්‍රපාතයට වැටී තිබෙන්නේ දුරදිග නො බලා කටයුතු කිරීම හේතුවෙනි. පැරැණි කියමනක් තියෙනවා" පනින්න පෙර සිතා බලනු" යනුවෙන් ඒවා තුළ වුව ද ගැඹුරු අර්ථයක් නිරූපණය වේ.

පසුවට හැඬීම, වැලපීම, සෝක කිරිම සිදුවන්නේ තුන්දෙර අයහපතට යෙදවීම තුළිනි. අප නිරතුරුව ම පසුවට සෝක නො වන කටයුතු ම සිදු කිරීමට සිතට ගත යුතු ය. සෝක වන කටයුතු එදිනෙද ජීවිතයට වුව ද සෘජුවම බලපානු ඇත.

අද බොහෝ පවුල් සංස්ථා බිඳ වැටී ඇත්තේ ද එම හේතුව තුළිනි. මෙලොව ජීවිතය අසාර්ථක වුවහොත් පරලොව ලෞකික ජීවිතය ද දුක් සහගත වනු ඇත. එබැවින් පසුවට දුක්වන කටයුතු නො කොට කරන කටයුත්ත සැනසිලිදායක එකක් ම වීමට තම තමන් විසින් ම වගබලා ගත යුතු අතර ම ඒ සඳහා සැමට ම ප්‍රඥා ඇස පහළ වේවා.


# අනේ හිමියනි මට ද දැන් දෙසා වදහළ මැනවි බුදු බණ

බොදු ගීයක මිහිර

නිවන් දුටු හිමි රුවන් පිළිරුව
පමණි මට අද ශේෂ වූයේ
හිමි දෙසූ බණ අසා ඇති මුත්
ඇසූයේ හිමිගේ හඬින් නොව
අනේ පිඬු සිටු පුතුට මෙන්
අනේ හිමියනි මට ද දැන්
දෙසා වදහළ මැනවි බුදු බණ
මහා කරුණාවෙන්...
මහා කරුණාවෙන්...

ගලක් වී නම් මමත් ඉවසමි
යකුළු පහරින් කැපී වෙන්වන
ඔබේ පිළිරුව නිම කරන්නට
කලාකරුවෙකු අතින් ලැබෙනා
එයින් හිමි හුරු කළා වූ
ශාන්තිය මට ලැබේවා...!

ගායනය – වික්ටර් රත්නායක
පද රචනය – ප්‍රේමකීර්ති ද අල්විස්
සංගීතය – වික්ටර් රත්නායක



**බුදුන් වහන්සේගේ අසම සම කරුණා ගුණය මූර්තිමත් කෙරෙන මෙම ගීතයට ගායනය සහ සංගීතය සපයන්නේ විශාරද ආචාර්ය වික්ටර් රත්නායකයන් ය. ගී පද වැල් සපයන්නේ ප්‍රේමකීර්ති ද අල්විස් ය. මේ ප්‍රතිභා පූර්ණ කලාකරුවන් දෙදෙනාගේ සුසංයෝගය ගීතයේ සාර්ථකත්වයට මනා පිටිවහලකි.**

සම්බුදු පිළිරුවෙහි කාරුණික දසුන ඇදී යන්නේ සැදැහැවත් බොදු ශ්‍රාවකයාගේ මනසෙහි ය. ඒ දෙස බලා සිටිනා ඔහුට බුදුන් වහන්සේගේ මහා කරුණාව මතකයට නැංවෙන අවස්ථා අපමණ ය. බුදුන් වහන්සේ සැම දිනකම අලුයම පිබිදී ලෝක සත්වයා දෙස බලන්නේ මහා කරුණා සමාපත්තියට සම වැදීමෙනි. උන් වහන්සේ කවුරු කොතැනක සිටියත් එක් වරක් හෝ තනියම හෝ ශ්‍රාවකයන් සමඟ යොදුන් ගණනින් ගම් නියම් ගම් වෙතපා ගමනින් ම හෝ ඍද්ධියෙන් ම වැඩම කළේ අන්‍යයන්ගේ යහපත උදෙසාම ය. අව් වැසි නොතකමින් ගස් යට, ගල් මත, සූන්‍යාගාර වෙත වාසය කරමින්, පිඬුසිඟා වඩිමින් අන්‍යයන් වෙනුවෙන් ම ඇප කැප වූ අයුරු අසම සම ය. රාජ මහා අමාත්‍යවරු, සිටුවරු, කසළ ශෝධකයන්, මිනී මරුවන්, මැරවරයන්, යක්ෂයන්, බමුණු බැමිණියන්, දැසි දස්සන්, ගොවි, කම්කරුවන් ආදී අපමණ පිරිස් වෙත සම්බුදු දෙනෙත විවර වූයේ මහා කරුණාවෙනි. ඒ ජීවමාන බුදුන් වහන්සේ අද දැකිය හැකි වන්නේ ත්‍රිපිටකය මනා ලෙස පරිශීලනය කිරීමෙනි.

ගීතයේ සඳහන් සේ සම්බුදු පිළිරුව දෙස බලා සිටින රසිකයා බණ පද අසා ඇත. එහෙත් ඔහුට බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ම බණ පද අසන්නටතරම් පිපාසයක් දැනෙන්නේ තම හදවත තෙමාලන බුදුන් වහන්සේගේ කාරුණාබර දසුනයි.

**'නිවන් දුටු හිමි රුවන් පිළිරුව**
**පමණි අද මට ශේෂ වූයේ**
**හිමි දෙසූ බණ අසා ඇතිමුත්**
**ඇසූයේ හිමිගේ හඬින් නොව'**

මෙමපැදි පෙළෙන් එය මනාව අනාවරණය වෙයි. මෙහි විශේෂත්වය වන්නේ අනේපිඬු සිටු පුතුට බණ දේශනා කළ අයුරින් ම බුදුන් වහන්සේට බණ දේශනා කරන ලෙස අයැදීමයි.

**'අනේපිඬු සිටු පුතුට මෙන්**
**අනේ හිමියනි මට ද දැන්**
**දෙසා වදහළ මැනවි බුදුබණ**
**මහා කරුණාවෙන්...**
**මහා කරුණාවෙන්...**

අනේපිඬු සිටු පුතුට බුදුන් වහන්සේ බණ දේශනා කළේ කෙසේ ද? යනුවෙන් රසික සිත විමසිලිමත් වෙයි. ඒ පින්බර පුවත මෙසේ ය.

අනේපිඬු සිටුතුමා රජගහ නුවර බලා පිටත්ව ගියේ භාණ්ඩ රැගත් ගැල් පන්සියයක් සමඟ ය. එදා වෙනදා මෙන් තමා පෙර මඟ පිළි නොගත් රජගහ සිටුතුමා සිටුගෙදර කටයුතු කළේ බොහොම යුහුසුළුව ය. එයට හේතුව විමසූ අනේපිඬු සිටුතුමාට දැනගන්නට ලැබුණේ, රජගහ සිටුතුමාගේ මැඳුරේ බුදුපාමොක් මහ සඟනට දානයක් සූදානම් කරන බව යි. බුදු කෙනෙකුගේ අග්‍ර උපස්ථායක වීමට පෙර සසරේ සිටම පැතූ අනේපිඬු සිටුතුමාට "බුදුන්" යන වදන ඇසීමෙන් ම ඇතිවූයේ බලවත් ප්‍රීතියකි. එතෙක් සිටුතුමා කිසි දිනක බුදු කෙනෙකු දැක හෝ අසා නැත. ඒ නිසා ම ඔහු "ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැකීමටට දැන් යා හැකි දැ" යි රජගහ සිටුතුමාගෙන් විමසුවේ ය. එහිදී ඔහු පැවසුවේ භාග්‍යවතුන් වහන්සේ දකින්නට සුදුසු මොහොත දැන් නොවන බවත්, හෙට දිනයේ සිටු ගෙදර දන් පිණිස වඩින බුදුන් වහන්සේ දැකිය හැකි බවත් ය. අනේපිඬු සිටුතුමා, ඒ අමා මෑණී බුදු පියාණන් වහන්සේ හෙට දිනයේ දකින්නට යමි'යි සිතමින් නැවත තම මැඳුර වෙත ගොස් රාත්‍රියේ සැතපී ප්‍රථම යාමයේ නින්දෙන් අවදිවී සිහි කළේ තමා මෙතෙක් නොදුටු බුදුරදුන් ගැන ය. බුද්ධාලම්භන ප්‍රීතියෙන් ම පිවිතුරු වූ සිතෙන් නැගුණු ආලෝකයෙන් ඔහුට දැනුණේ රාත්‍රිය පහන් වී හිරු උදා වූවා සේ ය. ඔහු වහා යහනින් නැඟිට සඳළුතලය වෙත පැමිණියේ රැය පහන් වි ඇතිදැ'යි සිතමිනි. නැඟී ඇති සඳෙහි දසුනෙන් තවමත් රාත්‍රිය බව දැනගත් ඔහුනො ඉවසිලිමත්සිතෙන් තෙවරක් ම අවධි වූයේමෙතෙක් නොදුටු බුදුරදුන් සිහි කරගෙන ය. බුද්ධාරම්මණයෙහි සමාධි වූසිතින් ඔහු නැවතඅවධි වූයේපශ්චිම යාමයේ අවසාන භාගයේදීය. ඔහුට බුදුරදුන් දැකීමට යන පින්බර ගමන උදා වූයේසත්මහල් ප්‍රාසාදයේ දෙරගුළු ඉබේම විවර වීමෙනි. පිවිතුරු සිතින් ම නැගුණු ආලෝකය හමුවේඔහු මැඳුරෙන් පිටතට නික්ම ගිය ද අමනුෂ්‍යයන්ගේ බාධා හමුවේ සිටුතුමා නැවත මැඳුර වෙත පිය නැඟීමට යුහුසුළු වූයේ බියට පත්ව ය. එය දුටු 'සීවක' දෙවියා සිටුතුමාට නො පෙනෙමින්, ඔහුට ඇසෙන සේ පැවසූ වදන් පෙළෙන් සිටුතුමාටඇති වූයේ ඉමහත් ධෛර්යයකි. ඔහුටබුද්ධාලම්භන ප්‍රීතියෙන් නැවත ආලෝකයපහළවුව ද මඳ දුරක් ඉදිරියට යද්දී නැවතත්අමනුෂ්‍යයන්ගේ බාධා ඇති විය. එහි දී ද 'සීවක දෙවියා' ඔහු නැවතබුදුරදුන් දකින්න යන ගමන උදෙසා උනන්දු කරන්නට ඇත්තේ සිටුතුමාගේ පෙර සසරෙ හි පිනෙහි මහිමය නිස යි. මෙසේ තෙවරක් ම පහළ වූ ආලෝකය හමුවේ සිටුතුමා, බුදුරදුන් වැඩ සිටි ශීත වනයට පිවිසියේඉමහත් ශ්‍රද්ධාවෙනි.ඔහු මෙසේ සිතී ය. බුදුන් වහන්සේගේ 'බුද්ධත්වය' සැබෑ නම් කිසිදිනක නොදුටු, නොදන්නා මාගේ නාමයෙන් අමතනු ඇත යන්න ය. සිටුතුමා දුර සිටම පැමිණෙන දුටු අසම සම බුදුන් වහන්සේ'සුදත්ත' මෙහි එන්නැ'යිඇමතී ය. එයින් බලවත් ප්‍රසාදයට පත් ශ්‍රද්ධාවන්ත සිටුතුමා උතුරා ගිය බුද්ධාලම්භන ප්‍රීතියෙන් සම්බුදු පාද මූලයේ වැඳ වැටුණේ නමස්කාර පූර්වකව ය.

එහි දී බුදුන් වහන්සේ, සිටුතුමාට දහම් දෙසා දාන කථා ආදියෙන් සිත සකසා,චතුරාර්ය සත්‍ය පහදා දුන් අයුරු අපූර්ව ය. මෙසේ සෝවාන් ඵල ලැබූ සිටුතුමා තෙරුවන්සරණ ගිය උපාසකයෙක් බවට පත් ව පසුදින බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ දනට ආරාධනා කළේ ඉමහත් ශ්‍රද්ධාවෙනි. ඔහු , බුදුන් වහන්සේට වස් වැසීමට ද ඇරැයුම්කර පහන් සිතින්කළ පරිත්‍යාගය ද උතුම් ය. 'ජේත කුමාරයාගේ' උයනෙහිඅටලොස් කෝටියක වියදමෙන් විහාරයක් කරවා බුදුපාමොක් මහ සඟරුවන වඩමවා අටළොස් කෝටියක වියදමෙන් කළ පූජෝපහාර ද ඉමහත් ය. මෙසේ සම්බුදු සසුන උදෙසා ඔහු පිදූ ධනය සිවු පනස් කෝටියක් බව ධර්මයේ සඳහන් ය.

ගීතයේ සඳහන් සේඅනේ පිඬු සිටු පුතුට දහම් දෙසූවා සේ තමාට ද දහම් දෙසන්නැ'යි බුදුන් වහන්සේට ඇරැයුම් කරන රසිකයා විටක රළු කළු ගලකට අරෝපණය වන්නේ සිතෙහි නැඟෙන ශ්‍රද්ධාව නිසා ම ය.තමා යකුළු පහරින් වෙන් වුණත් ඉවසා සිටින්නේ නෙළන කුළුණුබර බුදු පිළිම වහන්සේ උදෙසා ය. තවත් විටක කුළුණු බර බුදු පිළිම වහන්සේ නෙළන්නට තරම් රළු කළු ගලක් කපාඹපමට්ටම් කරන කලාකරුවා පෙන්වන දස්කම් විස්කම් සැබවින් ම විස්මිත ය. ඒ උදෙසා කලාකරුවා මෙන්ම රළු කළුගලකට ආරෝපණය වන්නාගෙන් මතුවන ඉවසීමේ ගුණය මහා කාරුණික බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් දුන් සන්සුන්පිළිවෙත සේ ය.

**ගලක් වී නම් මමත් ඉවසමි**
**යකුළු පහරින් කැපී වෙන්වන**
**ඔබේ පිළිරුව නිම කරන්නට**
**කලාකරුවෙකු අතින් ලැබෙනා**
**එයින් හිමි හුරු කළා වූ**
**ශාන්තිය මට ලැබේවා...!**

ජම්මික ප්‍රබෝධනී වැලිකල

# සුමංගල මාතා මහ රහත් තෙරණිය



**අපගේ බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ මහත් වූ වීර්ය වඩා සිව්සිඹියා සහිත ව නිකෙලෙස් වූ මහරහත් තෙරණින් වහන්සේ නමකි.**

උන්වහන්සේ පෙර බොහෝ බුදුරජාණන් වහන්සේ ශාසනය බබළන කාලයේ මිනිස් ලොව ඉපිද පින් දහම් කරමින් නිර්වාණය ප්‍රාර්ථනා කළා. ඉපිද – ඉපිද, මැරි – මැරී යන මේ සසර දුකෙන් එතෙර වේවායි! ප්‍රාර්ථනා කළා. මිනිස් ලොව සිදු කරගත් බොහෝ පින් නිසා ඇය දෙව්ලොව ඉපිද බොහෝ ආයුෂ වින්දා.

එම ආයුෂ කෙළවර අප ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ බුද්ධ ශාසනය බබළන කාලයේ සැවැත් නුවර දිළිඳු පවුලක සුමුත්තිකා නමින් උපන්නා. ඒ දුප්පත් මව්පියන් දරුවන් හදවඩා ගැනීමට බොහෝ දුක් වින්දා. ඒ නිසාම ඇය ද මව්පියන් සමඟ හරි හරියට වැඩ කළා. ගොවිතැන් කළා. දාසියක් සේ වැඩ කරමින් මව්පියන්ගේ ජීවන බරට රැකුලක් වුණා. ඇය කුඹුරේ වැඩ අවසන් කර නිවසට පැමිණ දිනපතා ම මෝල් ගසක් රැගෙන වී කෙටුවා. මෝල්ගස ඉතා බර වුවත් ඇය දිනපතා වී කෙටුවා.

වැඩිවියට පත් ඇයට මව්පියන් විසින් රැකියාව පිණිස බටපොතු වලින් කුඩ වියන්නෙකුට විවාහ කර දෙනු ලැබුවා. ඇය විවහා ජීවිතයේදීත් බොහෝ දුක් ගැහැට වින්දා. ස්වාමියා සමඟ වැඩපළ කළා. දුකසේ ම ජීවිතය ගෙව්වා. කල් යත්ම ඇය මහත් වූ පින් ඇති පුතකු බිහි කළා. ඔහුට සුමංගල යන නම තැබුවා. එතැන් පටන් සියල්ලෝ ම ඇය සුමංගල මාතා යන නමින් හැඳින්වූවා.

ඇයගේ ස්වාමියාගේ රැකියාව වූ කුඩ නිෂ්පාදනය කිරීමට ඇය කැමැති වුණේ නැහැ. සැමියාගේ සිරුරෙන් ගලන දහඩිය ඇයට ඇති කළේ පිළිකුලක්. හුණුදඬු රැගෙන දිනපතා ම කුඩ සෑදීමෙන් ගත කරන දුක්ඛිත ජීවිතය ඇයට එපා වුණා. ඒ ජීවිතය පිළිකුල් වුණා. “අන් අයට දුගඳ ගෙන දෙන්නා වූ අහිතකර වාතයක් මගේ සිරුරෙන් හමනවා වගෙයි මට දැනෙන්නේ. මම බත් උයන්නේ එකම හැලියේ. ඒ භාජනය බොහෝ කලක් තිස්සේයි මම පාවිච්චි කරන්නේ. ඒ හැලිය දැන් බොහෝ ම අපිරිසුදුයි. පිළිණු ගඳ එයින් හමනවා. මට ඒ ගඳ පිළිකුල්. මගේ සැමියා ළඟින් එන්නේ ඉවසිය නොහැකි දහඩිය දුගඳක්. ඔහු ලැජ්ජා නැති පුද්ගලයෙක්. ඒ නිසයි මට ඔහු ව නුරුස්සන්නේ. මට මේ දුක් විඳින ජීවිතයෙන් මිදෙන්නට ඕනේ. පුන්සඳ අහසේ බබළන්නේ යම් සේ ද, මගේ ජීවිතය ද එසේම බබළන්න ඕනේ. ඇය නිතර නිතර සිහි කළා.


ඇයගේ පුතා ඉතාමත් පින්වන්තයි. දක්ෂයි. තරුණ වියට පත් ඔහු ගිහි ගෙදර ඇති ඵලය කුමක් ද කියා සිතා මව්පියන්ගෙන් අවසර ගෙන පැවිදි වුණා. උන්වහන්සේ නොබෝ කලකින් උතුම් අරහත්වය සාක්ෂාත් කර ගත්තා. කාලයක් යද්දී වැඩිවියට පත් වූ ඇයගේ පුතා බුදු සසුනේ පැවිදිවූ පසු මහා කලකිරීමෙන් සිටි සුමංගල මාතාව ද ගිහි ගෙදර අතහැර දමා භික්ෂුණී ආරාමයේ පැවිදි වුණා. එදා පටන් ඇය භාවනාව ප්‍රගුණ කළා. දිනක් තමා ගිහි ජීවිතයේ දී විඳි දුක් ආවර්ජණය කර සංවේගයට පැමිණියා. විදසුන් වඩා අරහත්වයට පත්වුණා. උන්වහන්සේ උදානයක් ලෙස මෙසේ වදාළා.

- ”සුමුත්තිකා වන මම හැම දෙයින් ම මිදුණා. මෝල්ගහෙනුත් මිදුනා. කිසිදු ලජ්ජාවක් නැති සැමියාගෙනුත් මිදුණා. බත් උයපු හැලියෙනුත්, පිළුණු ගඳෙනුත් මිදුණා.

- චිටි චිටි සද්දෙන් රාග, ද්වේෂ, මෝහය නැති කර දැමුවා. මට දැන් ගසක් මුලට ගියාම තිබෙන සැප මෙතැකයි කියන්න බැහැ. මම ඉතාම සතුටු සිතින් සැපසේ ධ්‍යාන වඩනවා.

නයනා නිල්මිණී


# නුවණට සරිලන ගුණයෙන් උතුම් රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නා හිමි



**ධර්ම ශාස්ත්‍රාලෝකයෙන් ලක්දිව අන්ත පරිහාණිකර තත්ත්වයකට පත්ව තිබූ අවධියක් ලෙස 19 වන සියවසේ මුල් භාගය හඳුන්වාදිය හැකි ය. මෙම තත්ත්වයෙන් අප ධර්ම ද්වීපය ආරක්ෂා කර ගැනීමට බෝධි සත්ත්ව ගුණෝපේත වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේ ජාතියේ පිනින් පහළ වූහ.**

උන් වහන්සේ ආරම්භ කළ අත්‍යුදාර ශාසනික මෙහෙවර අඛණ්ඩ ව පවත්වාගෙන යාමට 19 වන සියවසේ අග භාගය වනවිට පහළ වූ අග්‍රගණ්‍ය මහා යතිවරයන් වහන්සේලා බොහෝ සිටිය හ. සංඝරාජෝත්තමයාණන් වහන්සේ ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයත් උන් වහන්සේලා අතර කීර්තිමත් මහා යතිවරයෙකු ලෙස පණ්ඩිතාචාර්ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ හඳුන්වා දිය හැකි ය.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රදේශයේ විසූ රයිගම විදානෙලාගේ දෙන් කොර්නේලිස් අප්පුහාමි හා අඹේපිටියගේ දෝන අද්‍රියානා හාමිනේ යන සැදැහැබර වාසනාවන්ත මව්පියන්ගේ පුත්‍රයෙකු ලෙස වර්ෂ 1828 මැයි මස 28 වැනිදා රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නා හිමියෝ ජන්මලාභය ලැබූ හ. වර්ෂ 1837 දී රත්මලාන පුරාණ විහාරයේ දී උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භාවයට පත් වූයේ අඬුපේ සෝණුත්තර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ ආචාර්යත්වයෙනි. පසුව පණ්ඩිතාචාර්ය මලිගස්පේ ශ්‍රී ධර්මකීර්ති, පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී සිද්ධාර්ථ යන බහුශ්‍රැත ධර්ම විනයධර මහ තෙරවරුන් වහන්සේලා වෙතින් ධම්මාලෝක හිමියෝ ධර්ම විනය, භාෂා ශාස්ත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලැබූ හ. වර්ෂ 1860 දී මහනුවර මල්වතු මහා විහාර මංගල උපෝසථාගාරයේ දී අධි සීල සංඛ්‍යාත උපසම්පදා සම්පත්ති ප්‍රතිලාභය ලැබූ අතර, එහි දී ඉදිරිපත් කළ අර්ථවත් පාලි නිබන්ධනය කෙරෙහි සංඝ සභාවේ බලවත් ප්‍රසාදය පළ කෙරිණි.



උන් වහන්සේ ගේ සාධු චරිතය ලොකු කුඩා සැවොම විමසා, කියවා, සිතා, ලියා ආදර්ශයට ගත යුතු ඉතා දුර්ලභ උදාර චරිතයකි.

උපසම්පදා සම්පත්ති ප්‍රතිලාභයෙන් පසු උන්වහන්සේ රත්මලාන පුරාණ විහාරස්ථානයේ වැඩ සිටිමින් එහි ප්‍රාචීන ශාස්ත්‍ර ශාලාවක් ඇති කළහ. එහි දීදිවයිනේ නන් දෙසින් පැමිණි ගිහි පැවිදි ශිෂ්‍යයන්ට තමා උගත් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දුන් හ. උන් වහන්සේ සිදු කළ ලෝක ශාසනික සේවාවෙහි ස්වර්ණමය යුගය ආරම්භ වන්නේ එතැන් සිටයි. විරරාත්‍රඥ මහතෙර නමක් ලෙස උන්වහන්සේ පිළිබඳ වූ කීර්තිරාවය රටපුරා පැතිරෙන්නට විය. ඒ අතර ධම්මාලෝක නා හිමි පිළිබඳ වෙසෙසින් පැහැදුණු කැලණිය ප්‍රදේශයේ ධර්ම ශාස්ත්‍රෝන්නතිකාමී සැදැහැවත් බෞද්ධ පිරිසක් වර්ෂ 1875 දී වස් විසීම සඳහා කැලණියේ දළුගමට වැඩම කරන ලෙස ආරාධනා කරන ලදුව උන් වහන්සේ එහි වැඩම වූ හ. වස් වසන අතරතුර සැදැහැවතුන් ගේ බලවත් ඉල්ලීම පරිදි ප්‍රදේශයට අඩුවක් ව තිබූ විද්‍යාස්ථානයක් ආරම්භ කළහ. එය නමින් ”විද්‍යාලංකාර ශාස්ත්‍ර ශාලාව” විය. එහි සමාරම්භක දිනය ලෙස සනිටුහන් වන්නේ වර්ෂ 1875 නොවැම්බර් 01 වන දිනය යි. මෙයින් උන් වහන්සේ ගේ ලෝක ශාසන සංග්‍රහය මල්ඵල ගැන්විණ.

මෙය උන්වහන්සේ ගේ ම වචනයෙන් කිවහොත් ශාස්ත්‍ර ශාලාවක් හා ධර්ම ශාලාවක් තැනීම යි. ශාස්ත්‍ර ශාලාව නම් පූර්වෝක්ත “විද්‍යාලංකාර ශාස්ත්‍ර ශාලාව” නොහොත් විද්‍යාලංකාර පිරිවෙන යි. ධර්ම ශාලාව නම් ප්‍රාචීන ප්‍රතීචීන භාෂා පිළිබඳ මෙන් ම නොයෙක් විෂයයන් පිළිබඳ දැනුමින් පාරප්‍රාප්ත රත්මලානේ ධම්මාරාම තෙරුන් වහන්සේ වැනි උගත් යතිවරයෙකු බිහි කිරීම යි.

කෙතෙක් කාර්ය බහුල ජීවන රටාවක් ගෙන ගිය ද ශ්‍රී ධම්මාලෝක නා හිමි ශාස්ත්‍රීය ග්‍රන්ථ කරණය ද අත් නොහළේ ය. රාජ චරිතය, විනය කතිකාවත, සත්‍ය විලාසිනී, සංස්කෘත වරනැගිල්ල ආදී ග්‍රන්ථ රැසක් රචනා කළ උන් වහන්සේ සිංහලයේ අක්ෂර වින්‍යාසය, න,ණ,ල,ළ ප්‍රයෝගය, පර්යේෂණ මාර්ගය, ග්‍රන්ථ සංශෝධන ග්‍රන්ථ සංස්කරණවිධි පිළිබඳ පළ කළ අදහස් එදත් අදත් වියත් පැසසුම් ලබති.

ශ්‍රී ධර්මාලෝක නාහිමි සිදු කළ අනුපමේය සේවාව පැලියගොඩ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමයි. එහිම සංවර්ධිත අවස්ථාවක් සනිටුහන් කරමින් තත් විශ්ව විද්‍යාලය කැලණිය දළුගම ප්‍රදේශයට ගෙන යන ලදී. මුල දී විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය වූ එය පසුව කැලණිය විශ්වවිද්‍යාලය බවට පත් විය. මෙම විශ්වවිද්‍යාලය පිහිටුවීමේ දී ධම්මාලෝක නා හිමියන් තුළ පැවති උදාරාධ්‍යාශය නම් පරාධීනත්වයෙන් වැනසී ගිය ජාතික අධ්‍යාපනය, භාෂාව, ධර්ම ශාස්ත්‍ර හා ගිහි – පැවිදි සබැඳියාව ශක්තිමත් පදනමක් ඔස්සේ ගොඩනැගීමයි. වර්ෂ 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක බෞද්ධ පාඨශාලාව ආරම්භ කිරීම තුළින් උන් වහන්සේ බලාපොරොත්තු වූයේ මිෂනාරි අධ්‍යාපනයෙන් බෞද්ධ ළමා පරපුරත්, බෞද්ධ ජනතාවත්, සුරක්ෂිත කිරීම යි.

ශ්‍රී ධම්මාලෝක නා හිමියන්ට ගෞරවයක් ලෙස කැලණිය වරාගොඩ විද්‍යාලය “ශ්‍රී ධම්මාලෝක විද්‍යාලය” ලෙසත්, එහිම පවත්වාගෙන යන කැලණිපුර බෞද්ධ බල මණ්ඩලීය දහම් පාසල “ශ්‍රී ධම්මාලෝක ධර්ම විද්‍යාලය” ලෙසත් හඳුන්වයි.

අව්‍යාජ වූ ගැඹුරු පාණ්ඩිත්‍යයෙන් හෙබි ශ්‍රී ධම්මාලෝක මහා ස්වාමීන්ද්‍ර චරිතය ගුණ සම්පත්තියෙන් ද අනූන වූ අයුරු මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියෝ මෙසේ විවරණය කරති.

ලෝකයෙහි ඇතැමෙක් විද්‍යාධරයෝ ය, බහුශ්‍රැතයෝ ය. එහෙත් ඔවුහු ගුණවත්හු නොවෙති.

තවත් සමහරෙක් ගුණ වෘද්ධයෝ ය. ප්‍රතිපත්තිගරුකයෝ ය. එහෙත් ඔවුහු නැණවත්හු නොවෙති. මෙසෙයින් ගුණයත්, නැණයත්, එක්තැන් වනුයේ කලාතුරෙකිනි. ගුණය නුවණෙහි ඵලය ලෙස සැලකිය හැකි වුව ද උගතුන් ගුණවතුන් වනු විරල ය. ගුණවතුන් උගතුන් වනු ද කලාතුරෙකිනි. එසේ කලට ගුණයට සරිලන නුවණත්, නුවණට සරිලන ගුණයත් එක්තැන් වූ උතුමන් විරලවීම කවර ආශ්චර්යයෙක් ද? එසේ ද වුවත් රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහාස්ථවිරපාදයෝ ගුණවෘද්ධයෙකි. එසේ ම ඥාන වෘද්ධයෙකි.

ධර්ම ශාස්ත්‍රෝද්දීපනය වෙනුවෙන් මුළු ජීවිතය ම කැප කළ රත්මලානේ ශ්‍රී ධම්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ උපතින් සැට වස් පිරෙත් ම ගිලන් බවට පත්ව වර්ෂ 1887 අගෝස්තු 15 වන දින රාත්‍රී අපවත් වී වදාළ සේක.



ඌරුගමුවේ අස්සජී හිමි

# අපාය සහ දිව්‍ය ලෝකය

සෙන් කතා



මහාචාර්ය ඉත්තදෙමළියේ ඉන්දසර හිමි

**සමුරයි යනු ජපානයේ අභිමානවත් රණශූර කුලය හඳුන්වන වචනයකි. පොදුවේ එම යුද හටයන් හැඳින්වූයේ ද සමුරයි යනුවෙනි. එක් දිනක් මෙම යුද හටයෙකුට අපාය සහ දිව්‍ය ලෝකය කුමක්දැයි දැන ගැනීමට අවශ්‍ය විය. කවරෙකුගෙන් එය අසා දැන ගත යුතුදැයි කල්පනා කළ ඔහුට මෙය නිවැරදිව දැන ගැනීමට නම් භික්ෂුවක් ම මුණ ගැසිය යුතු යයි තීරණය කෙළේ ය.**

එකල හකුඉන් නම් ප්‍රසිද්ධ සෙන් ගුරුවරයෙකු ඔහුගේ ගමට සමීප කන්දක් මුදුණේ කැලෑවක ආශ්‍රමයක් තනා ගෙන වාසය කළේ ය. නිරන්තරයෙන් භාවනාවේ යෙදුණු හකුඉන් 'සෙන්' ගුරුවරයාගෙන් තමාගේ ගැටලුවට විසඳුමක් ලබා ගත හැකි යයි විශ්වාස කළ සමුරයි, දුෂ්කර මඟ ගෙවා ඔහු හමුවීමට තීරණය කෙළේ ය.

ගල් සහිත වලගොඩැති දුෂ්කර ගමන් මඟ ගෙවා අධික වෙහෙසැති ව ඔහු ආශ්‍රමයට ළඟා විය. ආශ්‍රමයට පහළ දෙළෙන් ජලය පානය කර මඳක් වෙහෙස නිවාගෙන හකුඉන් ගුරුවරයා මුණ ගැසීමට අදහස් කළේ ය.

එලෙස කල්පනා කළ ඔහු දෙළෙන් ජලය පානය කර මුහුණ කට සෝදා පිරිසිදුව ආශ්‍රමය අසල රුක් සෙවනක වාඩි වී සිටියේ ය. හකුඉන් ගුරුතුමා ආශ්‍රමයෙන් පිටතට පැමිණෙනු එක්වරම දුටු සමුරයි, ගුරුතුමා වෙත ගොස් “මට දිව්‍යලෝකය සහ අපාය ගැන දැන ගන්න ඕන. ඇත්තටම ඒවා තියෙනව ද?” යනුවෙන් හකුඉන් ගුරුතුමාගෙන් ප්‍රශ්න කළේ ය.



ගුරුතුමා ඔහු දෙස විමසුම් සහිතව බලා “ඔබ කව්ද?” යනුවෙන් පිළිතුරක් වෙනුවට ප්‍රශ්නයක් ඇසී ය. පිළිතුරක්දීම වෙනුවට ප්‍රශ්නයක් ඇසීම ගැන මඳක් අසතුටු වූ සමුරයි “මම සමුරයි” යයි ඉමහත් ආඩම්බරයෙන් හා අභිමානයෙන් පැවසී ය.

“හා” යයි ශබ්ද නගා “උඹ මොනව ද හිතන්නෙ, ඔබට පුළුවන් ද එච්චර බුද්ධි ගෝචර සියුම් දෙයක් අවබෝධ කර ගන්න. උඹ නිකම්ම නිකම් අනුකම්පා විරහිත කෲර සොල්දාදුවෙක් පමණයි. “මෙතනින් පිටවෙලා යන්න, මගේ වටිනා කාලය උඹේ මෝඩ ප්‍රශ්නවලට විනාශ කළ නො හැකි යි” කියා පිටවෙන ලෙස ට අතින් ද සංඥා කළේ ය.

කෝපයෙන් දිලිහෙන සමුරයි ට හකුඉන් ගුරුතුමා කළ අපහාසය දරා ගැනීමට නොහැකි විය. සමුරයි ඔහුගේ කඩුව ඇද ගත්තේ ය. හකුඉන් මැරීමට සූදානම් විය. එවිට හකුඉන් ගුරුතුමා බොහෝම සන්සුන්ව “ඒක තමයි අපාය” යනුවෙන් පිළිතුරු දුණි.

සමුරයි අඩියක් දෙකක් පස්සට ගියේ ය. ඔහුගේ මුහුණ සෞම්‍ය විය. හකුඉන් ගුරුතුමාගේ නිහතමානී ප්‍රඥාව ගැන කල්පනා කළේ ය. ඔහුගේ කඩුව කොපුව තුළට දා ගත්තේ ය. ඔහු හකුඉන් ගුරුතුමා ළඟ වැඳ වැටුණි. “මේක තමයි දිව්‍ය ලෝකය” යනුවෙන් නැවතත් හකුඉන් ගුරුතුමා ශාන්තව පැවසී ය.

**ආදර්ශය : කෙනෙකු ද්වේෂ සහගත ව, ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් කටයුතු කරයි නම්, එතන ඇත්තේ අපායයි, දුකයි. මෛත්‍රී සහගත ව කරුණාවෙන් කටයුතු කරයි නම් එතන ඇත්තේ සතුටයි, දිව්‍ය ලෝකයයි. දිව්‍ය ලෝකය සහ අපාය මවා ගනුයේ තමා විසින්ම යි.**

# අනූහය කෝටියක් රහතන් වහන්සේ

# මහා සෑය ඉදිවන පින් බිමට වඩිති

ලංකාවේ බෞද්ධ ස්තූප 07



**ලක් බුදු සසුනෙහි පිනට ම පහළ වූ දුටුගැමුණු මහ රජතුමාගේ අවවාද පරිදි මහා ස්තූපය ඉදිවෙන භූමිය වෙත යන මඟ දෙපස මෙන් ම මහා සෑය පිහිටන බිම ද අලංකාර කරන ලෙස තම ඇමතිවරුන්වත් යොදවන ලදී. රජතුමාගෙන් ලැබුණු රාජ ආඥාවට අනුව අප ගෞතම බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රිය ගෞරවාදර ඇති ඔවුන් පැමිණ නොයෙක් ආකාරයෙන් අලංකාර කළහ.**

නුවරට ඇතුල්වන සතර දෙරටුවෙහි කරණවැමියන් තබන ලද්දේ ය. බොහෝ සුදු වස්ත්‍ර තබන ලද්දේ ය. ප්‍රණීත වූ ආහාර පාන තබන ලද්දේ ය. මහා සෑය ඉදිවන ස්ථානයට පැමිණෙන්නා වූ මහජනයා හිස් රැවුල් බා, දිය නා මධුර වූ ආහාරපාන තම තමන්ට කැමැති පරිදි ගැනීමෙන් පසු සුවඳ මල් රැගෙන සෑය පිහිටන භූමියෙහි රැස් වූහ.

තම තමන් ලද තනතුරු අනුව නියමිත වූ වස්ත්‍රාභරණයන්ගෙන් සැරසුණු මැති ඇමැති සේනාවගේ ආරක්ෂාව ඇතිව වටිනා වස්ත්‍රාභරණයෙන් සැරසුණු සතළිස් දහසක් මිනිසුන් පිරිවරාගෙන ආතත, විතත, විතතාතත, ඝන, සුසිර යන පංච තූර්ය නාදයෙන් ගිගුම් දෙවමින්, සක් දෙව් රජුගේ විලාශයෙන්, තැන නොතැන ගැන දන්නා විචක්ෂණ බුද්ධියෙන් යුතු දුටුගැමුණු මහ රජතුමා මහ ජනයා සතුටු කරමින් මහා සෑය පිහිටන භූමියට සම්ප්‍රාප්ත විය.

ඒ අවස්ථාවේ දී සිව්සැට බරණින් සැරසුණ සුන්දර නාටිකාංගනාවෝ දිව්‍ය කන්‍යාවන්ගේ සෝභා මතු කරවමින්, බුදුගුණ ගායනා කරමින් නැටුම් දක්වන්නට වූ හ.

ගෞතම බුදු සසුනේ පිළිසරණ ලැබූ ක්ෂීණාශ්‍රව මහරහතන් වහන්සේ ද, මේ අසිරිමත් වූ පින්කමට ලොව නා නා දිසාවන්ගෙන් ලක් දෙරණට සතුටු සිතින් වැඩම කළ සේක.

රජගහ නුවර ඉන්ද්‍රගුප්ත මහ රහතන් වහන්සේ අසූ දහසක් රහතන් වහන්සේලා පිරිවරා මේ පුණ්‍ය භූමියට වැඩි සේක. බරණැස ඉසිපතන මිගදායේ සිට ධම්මසේන රහතන් වහන්සේ දොළොස් දහසක් රහතන් වහන්සේලා සමඟ වැඩි සේක.

සැවැත් නුවර ජේතවනාරාමයේ සිට සැට දහසක් රහතන් වහන්සේලා සමග පියදස්සී මහ රහතන් වහන්සේ මේ පින්බිමට වැඩි සේක. රහතන් වහන්සේලා දහ අට දහසක් පිරිවරා විශාලා මහනුර මහ වනයේ කූටාගාර ශාලා විහාරයේ සිට බුද්ධරක්ඛිත රහතන් වහන්සේ වැඩි සේක. කොසැඹෑ නුවර ඝෝෂිතාරාමයේ සිට ධම්මරක්ඛිත රහතන් වහන්සේ තිස් දහසක් රහතන් වහන්සේලා පිරිවරා මේ පුණ්‍ය භූමියට වැඩි සේක. සංඝරක්ඛිත මහ රහතන් වහන්සේ උදේනි නුවර දක්ඛිණගිරි විහාරයේ සිට යතිවරයන් වහන්සේලා හතළිස් දහසක් සමග වැඩම කළ සේක. පාඨලීපුත්‍ර අග නගරයෙහි අශෝකාරාමයේ සිට මිත්තිණ්ණ රහතන් වහන්සේ එක්ලක්ෂ සැට දහසක් රහතන් වහන්සේලා පිරිවරා පින් බිමට වැඩි සේක. උත්තිණ්ණ රහතන් වහන්සේ කාශ්මීර මණ්ඩලයේ සිට දෙලක්ෂ සැට දහසක් රහතන් වහන්සේලා පිරිවරා පින් බිමට වැඩි සේක. මහා නුවණැති මහාදේව රහතන් වහන්සේ පල්ලාභෝග ජනපදයේ සිට සාර ලක්ෂ හැට දහසක් රහතන් වහන්සේලා පිරිවරා මේ උතුම් පින්බිමට වැඩි සේක. මහා ධම්මරක්ඛිත මහ රහතන් වහන්සේ යෝනක දේශයේ අලසන්දා නගරයේ සිට තිස් දහසක් රහතන් වහන්සේලා පිරිවරා පැමිණී සේක. වින්ධ්‍යා වන පියසේ වත්තනීය සේනාසනයේ සිට උත්තර මහ රහතන් වහන්සේ හැට දහසක් රහතන් වහන්සේලා පිරිවරා මේ පින් බිමට වැඩි සේක.

> ගෞතම බුදු සසුනේ පිළිසරණ ලැබූ ක්ෂීණාශ්‍රව මහ රහතන් වහන්සේ ද, මේ අසිරිමත් වූ පින්කමට ලොව නා නා දිසාවන්ගෙන් ලක් දෙරණට සතුටු සිතින් වැඩම කළ සේක.

චිත්තගුත්ත රහතන් වහන්සේ බුද්ධගා බෝධි මණ්ඩල වජ්‍රාසන විහාරයේ සිට තිස් දහසක් රහතන් වහන්සේලා සමඟ වැඩි සේක. චන්ද්‍රගුප්ත මහ රහතන් වහන්සේ අසූ දහසක් රහතන් වහන්සේලා සමග වනවාස ප්‍රදේශයේ සිට මේ පුණ්‍ය භූමියට වැඩි සේක. දකුණු දඹදිව කෛලාස මහා විහාරයේ සිට සූරියගුප්ත රහතන් වහන්සේ සමඟ අනූහය දහසක් රහතන් වහන්සේලා වැඩි සේක. මේ මහා පුණ්‍ය පින්කම උදෙසා ලංකාද්වීපයෙන් වැඩම කොට වදාළ රහතන් වහන්සේලා ප්‍රමුඛ මහා සංඝ රත්නයේ ප්‍රමාණය මෙපමණ යැයි ගණනය කළ නොහැකි යැයි ඉතිහාසයේ සඳහන් වේ.

මේ ආකාරයෙන් මහා සෑරදුන් වහන්සේට මංගල ගඩොල් පිහිටුවීමේ උත්සවයට අනූහය කෝටියක් පමණ වූ රහතන් වහන්සේලාත්, භික්ෂූන් වහන්සේලාත් මහා සෑය පිහිටුවන භූමිය වටකරගෙන රජතුමාට මැද සිටින්නට ඉඩකඩ තබා වැඩ සිටි සේක. ගෞතම බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවක මහ සඟ රුවන දුටු, දුටුගැමුණු මහ රජතුමා ශ්‍රද්ධාවෙන් මහත් සතුටට පත් විය. සතුටු සිතින් යුතුව උන්වහන්සේලාට පසඟ පිහිටුවා වන්දනා කර මහා සෑය පිහිටුවන භූමියට සුවඳ මල් පූජා කර, තුන් වටයක් පැදකුණු කොට ඒ මැද මංගල ලකුණ සහිත පුන් කළස් පිහිටුවා තිබූ ස්ථානයට පිවිසියේ ය.

> එම අවස්ථාවේ දී අනාගතය දකිනා මහා සෘද්ධිමත් සිද්ධාර්ථ නම් මහ රහතන් වහන්සේ, ඉතා විශාල ලෙස සීමාව ලකුණු කරමින් සිටි රජතුමා වළක්වන ලදහ.

මහා සෑය පිහිටුවන භූමියේ මැද පිහිටුවන ලද රන් කණුවට බඳින ලද රිදියෙන් තිම වූ සීමා දණ්ඩගෙන මහා සෑය පිහිටුවන සීමාව සලකුණු කරන ලෙස, ලෝක සත්වයාගේ යහපතට හේතුවන මහ සෑය කරවීමේ සිතින් යුතු මව්පිය දෙපාර්ශ්වයෙන් ම පිරිසුදු, මව්පියන් ජීවමානව සිටින, මනාකොට සැරසුණු ඇමැතිවරයෙකුට පවරණ ලද්දේ ය.

එම අවස්ථාවේ දී අනාගතය දකිනා මහා සෘද්ධිමත් සිද්ධාර්ථ නම් මහා රහතන් වහන්සේ එලෙස ඉතා විශාල ලෙස සීමාව ලකුණු කරමින් සිටි රජතුමා වළක්වන ලදහ. ඒ අනාගතයේ සිදුවිය හැකි කරුණු දෙකක් හේතුකොට ගෙන ය. එනම් මේ සා විශාල වට ප්‍රමාණයකින් යුතු සෑය සාදා නිම වන විට රජතුමා මරණයට පත්වේවි. ඒ වගේ ම විශාල වට ප්‍රමාණයකින් යුතු මහා සෑයක් ඉදිකිරීමෙන් අනාගතයේ දී පිළිසකර කටයුතු කිරීමට ද ඉතා දුෂ්කර කටයුත්තක් වේවි, යන්න හේතුවෙන් සිද්ධාර්ථ මහ රහතන් වහන්සේ රජතුමාට පෙන්වා වදාරණ ලදහ. සිද්ධාර්ථ මහ රහතන් වහන්සේ කෙරෙහි ඇති වූ අප්‍රමාණ ගෞරව භක්තිය නිසාත්, සංඝයා වහන්සේගේ අනුමැතිය නිසාත් රජතුමා අති විශාල වූ මහා සෑයක් කරවන්නට කැමැත්ත තිබුණත්, උන්වහන්සේගේ උපදෙස් පිළිගත්හ. එම උපදෙස්වලට අනුව රජතුමා මධ්‍යම වට ප්‍රමාණයෙන් යුතු මහ සෑයට මුල් ගල් තැබීමට සලකුණු කළහ.

දීපා පෙරේරා

# කළුතර දිස්ත්‍රික්කයේ පිරිවෙන් ඵලදායිතා වැඩ සටහන





පිරිවෙන්වල ඵලදායිතාව නංවනු පිණිස ආරම්භකෙරුණු වැඩසටහන් මාලාවේ කළුතරදිස්ත්‍රික් වැඩසටහන හොරණ විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙනේ දී පැවැත්වුණි. කළුතරදිස්ත්‍රික් පිරිවෙන් අධ්‍යක්ෂ බලගොඩ අමරජෝති හිමියන්ගේ අධීක්ෂණය පරිදි හොරණ විද්‍යාරත්න විද්‍යායතන පරිවේණාධිපති හිමි ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය මීට සම්පත් දායකත්වය දැක්වූහ. මෙහි දී බස්නාහිර පළාත් අධ්‍යාපන කාර්යාලය නියෝජනය කරමින් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්න මහතා ද ජාතික ඵලදායිතා කාර්යාලය නියෝජනය කරමින් ඵලදායිතා මෙහෙයුම් නිලධාරි (පිරිවෙන්) දේශප්‍රිය චන්ද්‍රසේකර, ඵලදායිතා නිලධාරි සම්බන්ධීකාරක රොෂාන් ප්‍රසාද් යන මත්වරු ද සහභාගී වූහ. කළුතරදිස්ත්‍රික් සියලු පිරිවෙන්වල පරිවේණාධිපති, නියෝජ්‍ය පරිවේණාධිපති හිමිවරු මීට සහභාගී වූ අතර සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපන රටාව මැනවින් පවත්වාගෙන යමින් නූතන තාක්ෂණය ද සාර්ථක ව භාවිතයට යොදාගනිමින් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමවේදය ඉදිරි වකවානුව තුළ පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධ ව දේශන කිහිපයක් ම මෙහි දී පැවැත්වුණි.




## පිරිවෙනටත් බුදුසරණ

**අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව සතිපතා බුදුසරණ පුවත්පත තුළින් ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක් වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරෙන අතර සියලු ලිපි, තොරතුරු හා ඡායාරූප සඳහා මෙම පිටුව වෙන් කෙරේ.**

**පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි අප වෙත යොමු කරන්න.**
budusarana@lakehouse.lk
**බුදුසරණ කර්තෘ මණ්ඩලය , ලේක්හවුස්, කොළඹ**

# පිරිවෙන් අධ්‍යාපනයේ මහනුවර යුගය

## පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය හා විකාශය 05

**ගිරා සංදේශ කාව්‍යයට අනුව තොටගමුවේ විජයබා පිරිවෙනේ ගිහි ශිෂ්‍යයන් පමණක් වෛද්‍ය විද්‍යාව හදාරා ඇත. අදත් ලංකාවේ පිරිවෙන් කිහිපයක දේශීය වෛද්‍යය ශාස්ත්‍රය ඉගැන්වුව ද ඒ සඳහා ලොකු උනන්දුවක් දක්වන බව නොපෙනේ.**

1505 දී ලංකාවට විදේශිකයන් පැමිණීමත් සමග අපගේ පිරිවෙන් අධ්‍යාපනය ද පරිහානියට පත්වන්නට විය. පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන්ගේ කාලවල දී මිෂනාරී අධ්‍යාපනය විකාශනය විය. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයට අහිතකර තත්වයක් උදා විය. කෙසේ වුව ද මහනුවර යුගයේ පහළ වූ වැලිවිට සංඝරාජ හිමියන් මෙම බටහිර අධිරාජ්‍යවාදීන් නිසා අඩපණ වූ අධ්‍යාපන ක්‍රමය නැවත ස්ථාපිත කරවීමට කටයුතු කළහ.

අපිස් සතොස් යනාදී ගුණාංගවලින් පිරිපුන් සීල ගුණයෙන් සුගන්ධවත් වූ කාරුණික ගුණයෙන් මෘදු වූ සිත් ඇති මහා භාග්‍යසම්පන්න වැලිවිට අසරණ සරණ සරණංකර සංඝ රාජෝත්තමයාණන් වහන්සේගේ අකලංක පවිත්‍ර චරිතාපදානය ගිහි පැවිදි සැමගේ ආත්ම සංයමය පිණිස හේතු වන්නේ ම ය. වර්තමාන සිංහල ඉතිහාසයෙහි ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ නාමය ගෞරවයෙන් අනුස්මරණය කළ හැකි ප්‍රධාන ශ්‍රී නාමය වන්නේ ය. උන් වහන්සේ 18 වැනි සියවසේ ශ්‍රී ලංකාද්වීපයෙහි සංජාත බෝධිසත්වවරයෙකු සේ පිළිගත හැකි ය. ලංකා ඉතිහාසයේ දුර්දසාපන්න අඳුරු කාල පරිච්ඡේදයක ජන්මලාභය ලැබ පිරිහී ගිය ශාසනික තත්ත්වය, භික්ෂු අධ්‍යාපනය හා ධර්ම ශාස්ත්‍රීය කටයුතු සමග භාෂා සාහිත්‍ය ව්‍යාපාරයන් යථා තත්ත්වයට පත් කළ සංඝ රාජ මා හිමියෝ ලක්දිව සුවඳවත් කළ අසහාය යුග පුරුෂයාණ කෙනෙක් වූ හ. වෙසෙසින් තරුණ භික්ෂු සමාජයට එකී චරිතාපදානය අගනා පාඩමක් ම වන්නේ ය.

18 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ශාසනික, ජාතික, සාමාජික, සංස්කෘතික හා අධ්‍යාපනික තත්ත්වය අන්ත පරිහාණිකර තත්ත්වයකට පත්ව තිබුණේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසි - ලන්දේසි ආධිපත්‍යයට නතුවීම, නිරන්තර යුද කෝලාහල හා ඒ නිසාම වූ ආර්ථික පරිහාණිය, මිෂනාරි ව්‍යාපාර නිසා බෞද්ධයන් අන්‍ය ආගම් වැළඳ ගැනීම යනාදී කරුණු නිසා ය. මේ නිසාම භික්ෂු සමාජය ද අන්ත පරිහාණිකර තත්ත්වයකට පත්ව තිබුණි. ශාසනික විනය කර්මයකට උපසම්පදා භික්ෂූන් වහන්සේලා සිව්නමක් වත් සොයාගත නොහැකි තත්ත්වයකට භික්ෂු සමාජය හිස් ව පැවතුණි. සංඝරාජ සාධු චරියාව හා සඟරජවත යන ග්‍රන්ථවලින් පෙනෙන පරිදි එකල විහාර සන්තක ඉඩකඩම් පරිහරණය කරමින් සිටියෝ ගණින්නාන්සේලා නම් වූ හ. ඔවුහු ශ්‍රමණ සාරුප්‍ය පැවතුම්වලින් බැහැරව දිවි ගෙවූ හ. බාලාවතාරය නම් වූ සරල පාලි ව්‍යාකරණ ග්‍රන්ථය ඉගෙනීමට සරණංකර සාමණේරයන් වහන්සේ හට දෙදෙනෙකු වෙත යාමට සිදුවීමත්, රාජ සභාවට පැමිණි බ්‍රාහ්මණයෙකු කී සරල සංස්කෘත ශ්ලෝකයක් තේරුම් කරදීමට සමත් සරණංකර හිමි හැර අන් කිසිවෙකු කන්ද උඩරට නොමැති වීමත් තුළින් භාෂා සාහිත්‍ය හා අධ්‍යාපනයෙහි පැවැති පරිහාණිකර තත්ත්වය ප්‍රකට වෙයි.

මෙවන් පරිසරයක මධ්‍යම පළාතේ බටහිරින් සුපිහිටි තුම්පනේ කඳුවලින් වට වූ බලකොටුවක් වැනි සරුසාර කෙත්වතුවලින් පිරිපුන් වැලිවිට ග්‍රාමයේ දී වර්ෂ 1698 ජූනි මස 19 වැනිදා සරණංකර මා හිමියෝ උපත ලද හ. පියා කුලතුංග නම් වූ අතර උන්වහන්සේ ද කුලතුංග නම් විය. සිය සොහොයුරා වූ කුලතුංග පටබැඳි මුදියන්සේ සමග රජ මාළිගාවෙහි සිටි බැවින් කුලතුංග ළදරුවා ද රජු ගේ පුත් තනතුරෙහි හැදුණු වැඩුණු බව සංඝරාජ සාධු චරියාවෙහි සඳහන් වෙයි. සිය පුතණුවන් රාජ පුරුෂයෙකු වනු දැකීම දෙමව්පියන් ගේ අභිප්‍රාය වූ අතර කුලතුංග දරුවා ගේ අභිලාෂය වූයේ ගිහි ජීවිතයෙන් වෙන් ව පැවිදිවීම යි.

**කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි**

**ඌරුගමුවේ අස්සජී හිමි**

# පහන් සිතක කවි



මෙවර ජයග්‍රාහී කවිය

## මරණය අබියස

ජීවිත අනියතය මරණය නියතම ය
ඒ බුදු වදන අනුව මරණය අත ළඟ ය
සියලුම බැඳීම් අතැර සිත තුළ දම් රස ය
රැඳුණොත් නිසැකව ම දෙයි සැනසිලි සුව ය

නවාතැන් පළකි ජීවන බව කතර
අතහැර දමා යන්න ට සිදු වෙයි විසිර
ඉසි කෝ මද මාන තණ්හා කර බැහැර
පැතුමක් පතමි ඉක්මනට ම කෙටි සසර

**මියුරු වික්‍රමසිංහ**
කොටදෙණියාව

## මෙත් සිතින් පින් දෙමි

දුක්බර දිවිය ගෙවනා මා මෙහෙණියකි
නෙවලා දහම් පොත් නැති මේ පින්බිමකි
සතර පෝයට ම බුදුසරණ ලැබෙන්නකි
නිවන් දකින්නට මෙය මා හැඟි මිණකි

ලොවට එළිය ගෙන දෙන්නේ හිරු මඬල යි
දහමින් දහම ගෙන එන්නේ බුදුසරණ යි
නැණ මල් පුදින්නේ ගත් මෙහෙවර අගය යි
පින් දෙමි මෙත් සිතින් බුදුසරණට බුදුසරණ යි

**මුත්තෙට්ටුවේ සුභාෂිණී මෙහෙණිය**
ප්‍රජාපතී ගෝතමී ආරාමය
මීගමුව

## දරු සෙනෙහස

මල් පුදින උදය හරි ලස්සන වේ ලූ
ඒ මල් පරදවා අම්මා පිබිදේ ලූ
දුක් ගිනි හදෙහි කොනකින් සඟවනවා ලූ
දරු සෙනෙහසට දුක අමතක වෙනවා ලූ

ඔබෙ ගුණ මෙපමණ යි මට නැහැ කිව හැක්කේ
ඒ ගුණ සුවඳ සැමද මතකේ ඇත්තේ
මතු බුදු වූ දිනෙක ඔබ මේ සංසාරේ
ඉන්නම් ඔබෙ දෙපා මුල මා අද වාගේ

**එම්. ඩී. පී . කෞෂල්‍යා**
මීගොඩ

## මහා කස්සප වෙහෙර

දකුණු ලකේ බෙන්තර පුරයේ තිබෙන
කස්සප හිමි රහත් ධාතූන් වැඩ හිඳින
තුන් ලෝකයේ එක ස්ථානයක් වන
මහා වෙහෙර අපි නමදිමු බැති සිතින

**යක්කලමුල්ලේ සරණ හිමි**
බෙන්තොට

## සිතක මහිම

බුදු මඟට පිළිපන්නෝ
සිත දමනය කර ගන්නෝ
සමත විදසුන් වඩන්නෝ
නිවන් සැප ලබන්නෝ

**මීගම්මන සුධම්මදින්නා මෙහෙණින් වහන්සේ**
වත්තේගම

## පෙර දිනයක

වාරුව නැතිවෙලා හයිහති ගිලිහිලා ගියත්
දුක් කඳ ගලා පියමන් යුග බැඳුණු වෙලේ
හද විල ගෙපැලේ ගොරහැඬි කටු කොළ අතරේ
දුන් ද පියුම් නැණ මල් දරු කළ තුටිනේ

පාසල් නිමාවී තිබුණ ද සොඳ ඇඳුරිඳුනේ
දුටුවිට මඟ තොටක පාරක දණ බිම තිව්වේ
වරදට දඬුවමක් ලෙස නොව පිය සෙනෙහසිනේ
ගුරු පිය මුතණුවනි එයමය නුඹහට නිවනේ

**ප්‍රාචීන මධ්‍යම බදුල්ලේ සුබිත හිමි**
ශ්‍රී ධර්මපාල පිරිවෙන
බෙල්ලන - අගලවත්ත

## මුනිඳු සුගත බස

අසිරිමත් දෙයකි මිනිසත් බව ලැබුම
ලෝ සතුනට සැපකි බුදුවරු බිහි වීම
වේ මය දුලබ හිමි දෙසු අම දම් ඇසුම
එලෙසම අසිරියකි කළ ගුණ සැලකීම

**අශෝකා අබේවර්ධන**
කැටඹුලාව

## රාහුල මාතා දැක්ම

පෙරුම් පුරා ආවෙමි මුළු සසර පුරා
ලෝ සත දනන් දුක් ගින්නෙන් මුදන තුරා
සන්තානයේ දැල්වුණී මෙත් සිසිල පෙරා
හිමිසඳු බුදු වුණා මගෙ නෙත් තිබෙන තුරා



**එල්. මල්ලිකා ජයසිංහ**
පානදුර

## ඇසළ සඳ

වෙසක් පොසොන් සඳ බැස ගොස් ඇසළ සඳ
පායාලා නිල් ගුවනේ දිලෙන විට
මුළු ලොව සිසාරා රැස් කඳ බෙදන විට
සිහිවේ උතුම් බුදු හිමිගේ නිමල ගුණ

බෝසත් කුමරු මහමායා මවු කුසෙහී
ඇසළ පෝයද ගැබ්ගත් සිරි අසිරී
අබිනික්මන් කළ රෑ ගුවනේ දිලිහී
ඇසළ සඳේ ඔබ සිටියා එළිය දිදී

සම්බුදු පදවි ලැබ කරමින් කෙලෙස් දුරු
ඉසිපතනයේ මිගදයට වැඩම කෙරූ
පස්වග තවුස් වෙත දම්දක් දෙසූ බුදු
හිමි දුටු ඇසළ සඳ අදටත් නුඹෙහි ගුරු

මාලබේ **කේ. ඩබ්ලිව් . සිරිසේන**



සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**



## ගෞතම බුදු සසුන

බව කතර සැඩ සුළඟ
හමන තැන
සිසිලස ද සැනසුම ද රැඳි
එකම තැන
කඳුළක දුකක සෝ සුසුමන්
නොමැති තැන
සවනත වැකුණු පමණින් තුටු
සිත් නිවන
ගොයුම් බුදු සසුන හව දුක
නිවන තැන

**නාපාන ඩී. එම්. සංජීව වසන්ත බණ්ඩාර**
මහනුවර

## ඇයි?

මල් පිපුණේ
ඇයි?
පරවෙන්න නේද?
ඔබ මා ඉපදුණේ
ඇයි?
මිය යන්න නේද?
මේ ටික
නොතේරෙන්නේ
ඇයි?
අවිද්‍යාව නේද?

**ලයනල් දසනායක**
පන්නිපිටිය

## නිවුණු සිත

**රාග සිතිවිලි සසල වූ විට**
**වේදනා දුක් දෙයි කසළ පව**
**කුසලයේ නිකසල පියුම් කෙමි**
**නිසල සිත් විල යැ'යි පිපී ඇත**
**සවන් සැනසෙයි නුවන් දිදුලයි**
**මනස් විල පිවිතුරු ව සැරසෙයි**
**නිවුණු සිත මා නිවා සනසයි**

**වික්‍රමසිංහ අතපත්තු**
**තලවත්තේගෙදර**

## වස්සානය

නිකිණි සඳ මෝරමින් අහස් ගැබ දිලෙන වා
අහස් කුස දිදුලමින් තරු රටා මැවෙන වා
වස් කාලේ සමරන්න පින් බිම් ද සැරසෙන වා
ෂඩ් වර්ණ කොඩි වැල් ද මඟ දෙපස දිලෙන වා

කසාවත කඨිනයක් ලෙසින් සකසා ගන්න ට
සැදැහැතියෝ සැරසෙනවා කුසලය ම ලැබ ගන්න ට
බුදු සමිඳු දෙසූ දහම එලෙසින් ම පවතින්න ට
සගරුවන සැරසෙනව බුදු වදන නොබිඳින් ට

**ගොඩරත්මලේ විපස්සි හිමි**
ආනන්ද සම්බෝධි විහාරය
කරවිලගල , පලාගල

## කවි කිවිඳියනට සතර පෝදාට ම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**

### බුදුසරණ පහන් සිතක කවි

BCC

**සම්පූර්ණ නම** :- ..........................................................
**ලිපිනය** :- ..........................................................
**දුරකථන අංකය** :- ..........................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**

තිස් වසරක යුද්ධය මැද නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව

13 කොටස



# විමලධර්ම දූත මධ්‍යස්ථානයේ නා හිමියෝ අතුරුදන් වෙති

**පිරිවෙන් අධ්‍යාපනය හැදෑරීම පිණිස නවදගල පදුමකිත්ති හිමියෝ අනුරාධපුර සාරානන්ද පිරිවෙනට වැඩම කළ අතර උන් වහන්සේ නේවාසික ව වැඩ සිටියේ ඊට කිලෝමීටර් 4ක් පමණ දුරින් පිහිටි විමලධර්ම දූත මධ්‍යස්ථානයේ ය.**

රාත්‍රියට ගම්මඩු ඇතුළු විවිධ සැණකෙළි නරඹන්නට සාමණේර හිමිවරුන් වැඩම කිරීම ගැන අවට දායකයන් උරණ වී එහි විහාරාධිපති හිමියන්ට තර්ජනාත්මක ස්වරයෙන් දෝෂාරෝපණය කළ අතර, ඒ අවස්ථාවේදී පදුමකිත්ති හිමියෝ එම පිරිසට බැණ වැදුණා හ. පසුදින පිරිවෙනට වැඩම කරද්දී මෙන්ම සාමණේර හිමිවරුන් ආපසු වැඩම කරද්දී ද නාහිමියන්ගේ කුටියේ දොර වසා තිබුණි.

නායක හිමියන් උදෙන්ම කුමන හෝ ගමනක් යන්නට ඇතැයි සාමණේර හිමිවරු සිතූහ. සවස් වන තුරුත් නාහිමියන් නොපැමිණි අතර පසුදින පිරිවෙන් පරීක්ෂණයක් තිබුණු හෙයින් සාමණේර හිමිවරුන් ඉක්මනින් සැතපෙන්නට වන්හ.

"උදේට අපි නායක හාමුදුරුවන්ට කතා කරමු" ඔවුහු කථිකා කර ගත්හ.

පසුදින උදෑසන ද සාමණේර හිමිවරුන් පිරිවෙන් ගමනට පෙර නාහිමියන් ගැන විමසා බැලූහ. එහෙත් නාහිමියන්ගේ කුටිය වැසූ විලස ම ය. සාමණේර හිමිවරු තැති ගත්හ.

"පොලිසියට කියමු ද?" එක් සාමණේර හිමිනමක් යෝජනා කළහ. එදින පිරිවෙනේ පරීක්ෂණයක් තිබුණු හෙයින් පිරිවෙනට වැඩම කිරීම අනිවාර්යය විය.

"අපි දවල්ට ඇවිත් මොකක් හරි කරමු" පදුමකිත්ති හිමියෝ යෝජනා කළහ.

දවල් පිරිවෙනේ සිට ආපසු වැඩම කරන විට ද නායක හිමියන්ගේ කුටිය ද එසේමය. සාමණේර හිමිවරු තැති ගත්හ. දින දෙකකට පෙර සිදුවූ සිදුවීම හමුවේ නායක හිමියන් යම් හෝ විපත්තියක් කර ගත්තාද? එසේ නොවේ නම් නායක හිමියන්ට දෝෂාරෝපණය කළ අය යම් හෝ අනතුරක් සිදු කළාද යන පැනයන් හට ගන්නට විය.

පදුමකිත්ති හිමියෝ එහිදී මුල් තැනක් ගෙන කටයුතු කළහ.

"මම ගිහින් ගුවන් විදුලි සංස්ථාවේ ගුණසේකර මහත්තය හමුවෙලා එන්නම්" ගුණසේකර මහතා නිතරම විහාරස්ථානයට පැමිණ නායක හිමියන් හා සාකච්ඡා පවත්වන්නෙකි. පදුමකිත්ති හිමියන් රජරට ගුවන් විදුලියේ ගුණසේකර මහතා හමු වී නාහිමියන්ගේ අතුරුදන්වීම සැල කළහ. ඒ පුවත කන වැකුණු ගුණසේකර මහතා පදුමකිත්ති හිමියන් සමඟ යළිත් විහාරයට ගියේ පළමුව නා හිමියන්ගේ කුටිය පරීක්ෂා කර බැලීම පිණිස ය.

ගුණසේකර මහතා කැටුව පදුමකිත්ති හිමියන් පැමිණෙන විට නා හිමියන්ගේ සොහොයුරියක් පැමිණ සිටියා ය. ඇය පැවසුවේ විමලරතන නාහිමියන් මැදවච්චිය පුහුදිවුල්වැව උන් වහන්සේගේ වෙනත් විහාරස්ථානයකට පැමිණ වැඩ වාසය කරන බවයි.

විමලරතන හිමියන් එසේ වැඩම කෙළේ තමන් විසින් දායක පිරිසට දෝෂාරෝපණ කළ නිසා බව දැනගත් පදුමකිත්ති නා හිමියෝ එම අවස්ථාවේ ම නාහිමියන්ගේ සොහොයුරියත්, තවත් සාමණේර හිමිනමක් ද සමඟ මැදවච්චිය පුහුදිවුල්වැව එම විහාරස්ථානයට වැඩම කළහ.



නාහිමියන්ගේ දෙපා නැමඳ නමස්කාර කර යළිත් අනුරාධපුර විහාරස්ථානයට වැඩම කරන ලෙස ඉල්ලා සිටියහ. නා හිමියන් මුලදී යම් අකමැත්තක් පළ කළ ද අවසානයේදී පදුමකිත්ති හිමියන්ගේ බලවත් ඉල්ලීම මත යළිත් අනුරාධපුරයට වැඩම කළහ.

ඒත් සමඟම පිරිවෙන් නිවාඩු ලබා දුන්නේ පිරිවෙන් පරීක්ෂණ නිම වූ නිසා ය. පදුමකිත්ති හිමියෝද නාගදීපය බලා පිටත් වූහ. උන් වහන්සේ වැඩම කළ දිනයේදී ම මන්නාරමේ සිට අශ්වයෙක් නාගදීප විහාරස්ථානයට ගෙන එන ලදී. පදුමකිත්ති හිමියන් සතුන්ට ඇඩි ආදරයක් කරුණාවක් දැක්වූ භික්ෂූන් වහන්සේ නමකි.

උන් වහන්සේ අශ්වයාට ඇඩි සේ ඇලුම් කරන්නටත් උගේ අවශ්‍යතා සොයා බලන්නටත් විය. අශ්වයා ද පදුමකිත්ති හිමියන්ට ඇඩි ඇල්මක් දැක්වූ අතර පදුමකිත්ති හිමියන්ගේ සමීපතමයකු බවට පත් විය.

"උන්නාන්සේගේ සත්ත්ව කරුණාව නම් බොහොම හොඳයි, ඒ වුණාට කිලිනොච්චියේ අපේ පන්සලට යනව හොඳයි, එහේ ඉන්නෙ එක හාමුදුරුනමක් විතරයි, හිටපු අනිත් උන්නාන්සෙත් වෙන පන්සලකට ගිහිල්ල" නාගදීපයේ නා හිමියෝ පදුමකිත්ති හිමියන්ට පැවසූහ.

ඒ වන විට කොටි ත්‍රස්තවාදීහු යාපනය ඇතුළු ප්‍රදේශ රැසක විවිධ කොල්ලකෑම් මෙන්ම පහරදීම් ඇතුළු කලබල ඇති කර තිබුණි. කිලිනොච්චිය බැංකුවක් කොල්ල කා එහි රත්තරන් බඩු හා මුදල් රුපියල් ලක්ෂ 6කට අධික මුදලක් ද කොල්ල කා තිබුණි. එම බැංකුව ද පිහිටා තිබුණේ නාගදීප විහාරයට අයත් කිලිනොච්චියේ ලුම්බිණි විහාරයට නුදුරිනි.

කිලිනොච්චිය වඩාත් වැදගත් වූයේ වවුනියාව හා යාපනය අතරමැද ම පිහිටි නගරය නිසාය. කොළඹ සිට නාගදීපය දක්වා ගමන් කරනා ඇතැම් වන්දනාකරුවන් කිලිනොච්චියේ මේ විහාරයේ මඳක් ගිමන් හැර යන පුරුද්දක් ද තිබුණි.

තමන් වහන්සේ එම විහාරයට යැමට පාර නොදන්නා බව පදුමකිත්ති හිමියන් නා හිමියන්ට පැවසූ අතර නා හිමියන් පැවසුවේ 'උන්නාන්සේට අනුරාධපුරයට වඩින්න පුළුවන්, කිලිනොච්චියට වඩින්න පාර දන්නේ නැහැ, ඉන්නවකො මම පාර හරියටම වරදින්නෙ නැතුව යන්න ලියල ම දෙන්නම්" කියමින් කිලිනොච්චියේ ලුම්බිණි විහාරයට යා හැකි පාර පැහැදිලිව ම ලියා ඇඳ දුන්හ.

ඒ වන විට කොටි ත්‍රස්තවාදී ක්‍රියා ආරම්භ වී තිබුණු හෙයින් හමුදාව ඇතැම් තැන්වල කඳවුරු බැඳීමට සූදානමින් සිටිනු දක්නට ලැබුණි.

නා හිමියන් විසින් ලබා දුන් මාර්ගය අනුව පසුදින කිලිනොච්චියට යාමට පදුමකිත්ති හිමියෝ අදිටන් කර ගත්හ.

"ආයෙ මොකක්ද හෙටක්, දැන්ම ගියොත් හවස් වෙන්න කලින් යන්න පුළුවන්, ආ මේ සල්ලිත් මඟ වියදමට තියා ගන්න" යැයි කියමින් නා හිමියෝ මුදල් ඇමූ ලියුම් කවරයක්ද පදුමකිත්ති හිමියන්ට ලබා දුන්හ.

ඒ නියෝගයට විරුද්ධ වීමට හැකියාවක් පදුමකිත්ති හිමියන්ට තිබුණේ නැත. උන් වහන්සේදිවා දානයෙන් පසුව කිලිනොච්චියට යාමට සූදානම් ව නා හිමියන්ට වැඳ පිටත් වීමට සූදානම් වන විටම ලියුම්කරු පැමිණියේ ය. එක් ලියුමක් පමණක් නා හිමියන් නමට තිබුණු අතර එම ලියුම අනුරාධපුරයේ විමල ධර්මදූත මධ්‍යස්ථානයේ විමලරතන හිමියන් විසින් එවන ලද්දක් බව දැක, "ඔහොම පොඩ්ඩක් ඉන්නව, විමලරතන උන්නාන්සෙ ලියුමක් එවන්නෙ මොකක් හරි ලොකු හේතුවකට විතරයි, මොනව හරි මැරැටි වැඩක් කළාද? " යැයි අසමින් උන් වහන්සේ ලියුම කඩා බැලූහ.



*මතු සම්බන්ධයි....*

**තාරක වික්‍රමසේකර**

## ඓතිහාසික සේරුවාවිල රජමහා විහාරයේ 96 වැනි ලලාට ධාතු පූජෝත්සවය

### අගෝස්තු 26 සිට සැප්තැම්බර් 02 දක්වා

ඓතිහාසික සේරුවාවිල මංගල රජමහා විහාරස්ථානයේ 96 වැනි වාර්ෂික ලලාට ධාතු නිකිණි මහා පින්කම අගෝස්තු 26 සිට සැප්තැම්බර් 02 දක්වා පැවැත්වීමට සියලු කටයුතු යොදා ඇත. විහාරාධිපති නැගෙනහිර, තමන්කඩුව දෙපළාතේ ප්‍රධාන සංඝ නායක දෙම්පේ, පාළුගම භාවනා මධ්‍යස්ථානාධිපති, ආචාර්ය මුංහේනේ මෙත්තාරාම හිමියන්ගේ අනුශාසකත්වයෙන් මෙම පින්කම්මාලාව පැවැත්වේ. අගෝස්තු 26 සවස සතිපිරිත් දේශනාව ආරම්භ කෙරේ. 27 සිට 31 දක්වා ලලාට ධාතු පූජාව, විදුලි ආලෝක පූජාව, ධර්ම දේශනා පවත්වන අතර, සති පිරිත් දෙසුම අවසන්වන දින අපවත් වී වදාළ නායක ස්වාමීන් වහන්සේලාට සහ නැසීගිය විහාරස්ථ දායක පින්වතුන්ට පුණ්‍යානුමෝදනා කර සියක් නමක් විෂයෙහි සඟසතු දානමය පින්කමකි.

සැප්තැම්බර් (01) පොහෝ දින විශේෂ පොහොය වැඩසටහන, රාත්‍රී ආලෝක පූජාව, ලලාට ධාතු පූජාව, දේවදූත පෙරහර, දෙරකඩ අස්න දේශනාව සහ මල්වෙඩි සංදර්ශනයක්ද පැවැත්වේ. රටේ පවතින කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය සැලකිල්ලට ගෙන මෙවර පෙරහර මහජනතාවට විවෘත නො වන අතර, පෞරාණික චාරිත්‍රවලට පමණක් සීමා කෙරේ. සැප්තැම්බර් (01) ද පොහෝ දින සියලු ආගමික වැඩසටහන් ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ සජීවී ව විකාශය කෙරේ.

## කවරයේ කතාව



ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අභිමුව ඒහි භික්ෂුභාවයෙන් පැවිද්ද ලැබූ යසකුල පුතු මහණ වූ පුවත ඇසූ මිතුරන් සිව්දෙනෙකු වූ විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති යන සිටුකුල පුතුන්ද බුදුරජාණන් වහන්සේ වෙත එළැඹ සෝවාන් ව ඒහි භික්ෂු සම්පත්තිය ලැබූහ. නැවත ද භාග්‍යවතුන් වහන්සේ ඔවුනට බණ වදාළ සේක. එය ඇසූ ඒ භික්ෂූහු සියලු කෙලෙස් නසා රහත් භාවයට පත්වූහ.

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### නිකිණි අමාවක

අගෝස්තු 18 අඟහරුවාද පූර්වභාග 10.39 න් අමාවක පෝය ලබා 19 බදාදා පූර්වභාග 08.11 න් ගෙවේ.
අඟහරුවාද සිල්.

### බිනර පුර අටවක

අගෝස්තු 25 අඟහරුවාද අපරභාග 12.22න් පුර අටවක පෝය ලබා 26 බදාදා පූර්වභාග 10.39 න් ගෙවේ.
අඟහරුවාද සිල්

### බිනර පුර පසළොස්වක

සැප්තැම්බර් 01 අඟහරුවාද පූර්වභාග 09.39 න් පසළොස්වක පෝය ලබා 02 බදාදා පූර්වභාග 10.51 න් ගෙවේ.
අඟහරුවාද සිල්.

### බිනර අව අටවක

සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා පූර්වභාග 02.06 න් අව අටවක පෝය ලබා 11 සිකුරාදා පූර්වභාග 03.35 න් ගෙවේ. බ්‍රහස්පතින්දා සිල්.

වැඩිහිටි නිවාසයකට
පිංදීමට හැකි
වැඩිහිටි අයෙක් අවශ්‍යයි.
076 0598413

සතර පෝයටම
නිකුත් වන
එකම
සදහම්
සංග්‍රහය
බුදුසරණ

විහාර සිතුවම් කිරීම
ප්‍රතිසංස්කරණ සහ නව
නිර්මාණ සඳහා විමසන්න.
චානක ප්‍රසන්න
"සරසවි" චිත්‍ර කලා අසපුව
දු.ක. 011-2970099
071-5516544

එක් නමක් හෝ දෙනමක්
සිටින විහාරයක ආගමික
කටයුතු කරගෙන සිටීමට
විශ්වාසයෙන් අමතන්න.
072-4646461

සියම් නිකායේ වයස 45ක්
වන උපසම්පදා 10ක්
වන භික්ෂූන් වහන්සේට
පන්සලක් සොයයි.
077-6588941

අනාගත සිහින
සැබෑකර ගැනීමේ
එකම මග
මංගල යෝජනා
තීරයයි
සිළුමිණ
සිලුமின The Silumina

පැවිදිකර ගැනීමට පිංවන්ත දියණියන් දෙදෙනෙකු හා
වගකීම් වලින් තොර උපාසිකාවක් අවශ්‍යයි
පහත ලිපිනයට හෝ දුරකථනයට දැනුම් දෙන්න.
071-2543429 / 041-2230956
පතිරත්න ආරාමය,
සුධර්මාරාම පාර, මඩහ - බටහිර, මාතර.

## ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ සංඝ සභා කාර්යාලය විවෘත කිරීම

වැලිතර මහ කරාවේ ඤාණවිමලතිස්ස මහ නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රි.ව. 1803 දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා අමරපුර මහ නිකාය වර්තමානය වන විට වසර 218ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය පෝෂණය කරමින් ලාංකේය ශාසනෝදය වෙනුවෙන් දැවැන්ත කාර්යයභාරයක් ඉටු කරමින් සිටී. එම අමරපුර මහ සංඝ සභාවේ අභිනව සංඝ සභා කාර්යාලය මේ මස 15 වන දින පස්වරු 04.00 ට ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහ නායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහ නාහිමි ප්‍රමුඛ මහ සංඝ රත්නයේ ආශීර්වාදයෙන්, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් සඟසතු කොට පූජා කිරීමේ මහෝත්සවය පැවැත්වීමට කටයුතු යොදා ඇති බව ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ මහ ලේඛකාධිකාරී මහාචාර්ය පල්ලෙකන්දේ රතනසාර අනු නා හිමියෝ දන්වා සිටිති.

## පිහිට පතයි

බොරලැස්ගමුව, නිලම්මහර, පරාක්‍රම මාවතේ අංක 257 හි පදිංචි යූ.ඩී.අජිත් ප්‍රසන්න පෙරේරා මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට "ඕ පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව ද කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් 0788011064, 0777654843 දුරකතනයෙන් වැඩි විස්තර විමසිය හැකි බවද කියයි.

'සබ්බ දානං ධම්ම දානං ජිනාති'
සියලු දානයන්ට වඩා ධර්ම දානය උතුම් ය



ධර්ම දානයේ කුසලය මෙලොවදීම අත් දකින්න
ඔබට මාහැඟි අවස්ථාවක්
හරවත් දහම් කරුණුවලින් සුපෝෂිත
නව විශේෂාංග සමඟින්
බුදුසරණ
පුවත්පත, විහාරස්ථාන, පාසල්, දහම් පාසල් වෙත
බෙදා දීමේ පුණ්‍යකර්මය උදෙසා
සැදැහැති ඔබට ද ඉදිරිපත් විය හැකිය
මේ උතුම් පින්කමට ඔබට අවශ්‍ය බුදුසරණ පුවත්පත්
කලින් ම වෙන්කරවා ගන්න
විමසීම් :
0112 429378 - දිනේෂ්
0112429381 - චම්පා

## මෙත් සිත

මෙත්තා යනු හිතවත් බවයි. සැබෑ මිත්‍රත්වය යි. නැතිනම් මෛත්‍රිය යි. මිතුරකු පිළිබඳ තමා තුළ ඇති හිතවත්භාවයට සමාන හිතවත් භාවයක් සියලු ජීවීන් කෙරෙහි ඇති කර ගැනීම මෛත්‍රී භාවනාවෙන් සිදු වෙයි. මිත්‍රත්වය සියලු ජීවීන් කෙරෙහිම දැක්වීම උසස් මානුෂික ගුණාංගයකි. සැබෑ මිතුරා සිය මිතුරාට අවැඩක්, විපතක් වෙනවාට අකමැති වේ. ඔහු මිතුරාගේ දියුණුව ම අපේක්ෂා කරයි. මිතුරා සම්බන්ධයෙන් ද ඇති කර ගන්නා හිතවත්කම මෛත්‍රිය යි. මෙම තත්වය උසස් හැසිරීමක් වන්නේ ආයාසයකින් තොරව තමාට හමුවන ඕනෑම අයකු සම්බන්ධයෙන් හිතවත් බවක් ගොඩනගා ගැනීමට හැකියාවක් පවතී නම් පමණි. මෛත්‍රී සහගත සිතිවිලි සහිත පුද්ගලයා සියලු ජීවීන් සැපෙන් සිටිනු දැකීමට කැමැති වෙයි. නිරන්තරයෙන් මෙවැනි සිතිවිල්ලක් පවත්වා ගැනීමට නම් එය භාවනාවක් ලෙස ප්‍රගුණ කළ යුතු ය.

**එච්.ඒ.පී.ඩබ්.ඩබ්. විචක්ෂණා**
9 ශ්‍රේණිය
සුමනා බාලිකා විදුහල – රත්නපුරය

## ආදර අම්මා

සැනසුම සොයන්නට වෙර දරන නුඹ
කලේ නැත අරුමෝසම් රූපයට
ගත්තේ ද නැත රස අහර කුස තුළට
වෙනස්කම් කලේ නැත නුඹ අපහට කිසි දිනෙක...
කටුක වූ රුදු ජීවන මාර්ගය මත
ශක්තිය වී අපේ කුඩා පැල්පතට
ආදරය එකමුතුකම අප තුළ රඳවන්ට
හැකිවූවා ය නුඹහට
මවුනි මගේ ආදරණීය...



**ලක්ෂිකා ධනංජනී වික්‍රමරත්න**
ශ්‍රී අභිනවාරාම දහම් පාසල – රත්නපුරය

## මගේ දහම් පාසල

මගේ දහම් පාසල ඇතුල්කෝට්ටේ ශ්‍රී මහින්ද්‍රාරාමය යි. අපේ ගුරුවරු පළවැනි ශ්‍රේණියේ සිටම යහපත් ගතිගුණ කියා දෙයි. සෑම වර්ෂයක ම නො වරදවා ම පෙරහර හා කළා උළෙල භික්ෂූන් වහන්සේ හා ගුරුවර, ගුරුවරියන් විසින් එක්ව පවත්වනු ලබන්නේ ළමයින්ට සහභාගී වීම සඳහා ය. සෑම මසකම යහපත් බෞද්ධ දරුවන් බිහි කිරීම සඳහා සිල් සමාදන්වීමේ වැඩසටහන් ද පවත්වනු ලබයි. සෑම ඉරුදිනකම ගුරුවර, ගුරුවරියන් පාන්දරම පැමිණ අපට පන්සල ඇමදීම සඳහා උපදෙස් ලබාදෙයි. ඉන්පසු පන්සිල් සමාදන්වීම, විහාරස්ථානයේ මලියදේව හාමුදුරුවන් වහන්සේ විසින් කරවනු ලැබේ. ගුරුවර, ගුරුවරියන් පාඩම් වැඩ කටයුතු අතරතුර යහපත් ගතිගුණ. හොඳ පුරුදු ද කියා දෙයි.

**අයි.ජී.ලිසරි දහමියා**
09 ශ්‍රේණිය
ආනන්ද බාලිකා විද්‍යාලය – මරදාන

## ඇසුරක වෙනස

ඉස්සර කාලේ දඹදිව උත්තර පංචාල නමින් නුවරක් තිබුණා. එහි පංචාල නම් රජෙකු රට පාලනය කළා. දවසක් රජතුමා දඩයම පිණිස කැළයට පිටත් වුණා. මහ වනය මැද දී රජතුමාට ඇසුණා ගිරවු දෙදෙනෙකු කතා කරන ආකාර ය. එක් ගිරවෙක් අල්ලපියව්, ගහපියව්, ඇනපියව් කියා කියනවා. අනෙක් ගිරවා ඉතාම මිහිරි වචනයෙන්, ප්‍රිය වචනයෙන් කතා කරනවා. හොඳ අය ඇසුරු කළ ගිරවා හොඳ ගිරවෙකු වූ හැටිත්, නරක අය ඇසුරු කළ ගිරවා නරක් වූ හැටිත් රජතුමා අවබෝධ කර ගත්තා.

**පියරපන්දෝවේ උත්තමඥාන හිමි**
මූලික ශ්‍රේණිය
සුමන සාමණේර ආයතනය
හඳපානාගල




සංස්කරණය - **නයනා නිල්මිණී**

## මගේ පාසල

ගණේමුල්ලේ පිහිටා ඇති හේමමාලී මහා විදුහල නමින් ඉතා ප්‍රසිද්ධ, සුන්දරත්වයෙන් පිරි පාසල මගේ පාසල යි. අප විදුහලේ සියලු දෙනා සහයෝගය, සුහදත්වය, ප්‍රිය වචනය ආදී ගුණාංගයන් පුරුදු පුහුණු කරමු. දරුවන් වන අපට ශිල්ප මනාව පිහිටන අයුරින් එහි ගුරු මව්පියවරු ශිල්ප ශාස්ත්‍ර ලබාදීමට බොහෝ සමත් වෙයි. ගමේ පාසල හොඳම පාසල යන්න විරුදවලිය ලත් පාසල් අතරට මගේ පාසලත් අයත් ය. බොහෝ දෙනාගේ පැසසුමට ලක්වන මගේ පාසල මමද එසේම ගෞරවාදරයෙන්, භක්තියෙන් යුතුව රැක ගනිමි.

**ඩබ්.ඒ. ඉෂාරා හංසනී**
11 වන ශ්‍රේණිය
හේමමාලි මහා විදුහල – ගණේමුල්ල

### බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

**සම්පූර්ණ නම** :– ..................................................
**පාසල / දහම් පාසල** :– ..................................................
**ඉගෙනුම ලබන ශ්‍රේණිය** :– ..................................................
**ලිපිනය** :– ..................................................
**දුරකථන අංකය** :– ..................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**


## ප්‍රාර්ථනාව

දස මස මා කුසෙහි දරාගෙන සිටි මගෙ අම්මා
ගතෙහි තිබුණු ලේ කිරි කර පෙවූ මගෙ අම්මා
ලෙඩක් සැදුණු විට මුළු රැය අවදිව සිටි අම්මා
නිවන් දකීවා මගේ ආදර සුදු අම්මා

දවසම වෙහෙස ව වැඩ කළ මගේ ආදර තාත්තා
ගෙදර ඇවිත් මාව වඩාගත්තා මගෙ තාත්තා
උපන් දිනේ මා සනසා තෑගි දුන්න තාත්තා
නිවන් දකීවා මාගේ ආදර සුදු තාත්තා

**කෙමින්දි හසරා පරණවිතාන**
5 ශ්‍රේණිය
සිරි විමලසිරි ඉංග්‍රීසි දහම්පාසල – පොල්පිටුමූකලාන

## ළමා ප්‍රහේලිකා අංක 20



**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1. මෙම ඉන්දියානු ලෙන් විහාර බෞද්ධ චිත්‍ර සඳහා ප්‍රසිද්ධ ය.
4. සිදුහත් කුමරුන්ට නම් තැබීමට පැමිණි බමුණන්ගෙන් පළමුවැන්නා ය.
6. ත්‍රිපිටකයෙන් එකකි
8. බුදුන් වහන්සේ මේවා දසයකින් ශක්තිමත් වූ බව කියැවේ.

### පහළට

2. ඈත පෙරදිග පිහිටි බෞද්ධ රටකි
3. ලංකාවෙන් ගෙනගිය මෙම දෙවඟනගේ අගනා ප්‍රතිමාවක් ලන්ඩන් කෞතුකාගාරයේ ඇත.
5. බුද්ධ පරිනිර්වාණය සිදු වූයේ මෙම රජුන්ගේ රාජ්‍යයේ දී ය.
6. නියමිත වේලාවෙන් පිටත ආහාර ගැනීම මෙම භෝජනය ලෙස දැක්වේ.
8. දේව ධර්මය ලෙස හඳුන්වන ගුණාංග දෙකෙන් එකකි.

## පෝය දවස



**මරදන්කඩවල සුධම්ම හිමි**
01 වන ශ්‍රේණිය
විද්‍යාවාස මහා පිරිවෙන
මීරිගම

## අපේ පන්සල



**විනයරක්ඛිත හිමි**
මූලික ශ්‍රේණිය
ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙන
මහරගම

### බුදුසරණ සදහම් අරණ ළමා සමාජයේ සාමාජිකයෝ

650 ජනනදගම කලයාණසිරි හිමි - 04 වන ශ්‍රේණිය
ශ්‍රී සෝරත පිරිවෙන – ගාල්ල
651 මරදන්කඩවල සුධම්ම හිමි - 1 වන ශ්‍රේණිය
විද්‍යාවාස මහ පිරිවෙන – මීරිගම
652 එච්. ඒ. අශේන් ඉමංශ- 7 වන ශ්‍රේණිය
සුමනතිස්ස ධර්ම විද්‍යාලය – මාතර
653 ඊ. ජී. නෙත්මි සංසලා - 11 වන ශ්‍රේණිය
මීදුම ශ්‍රී සුගත දහම් පාසල – රඹුක්කන
654 ආර්.ඩී. හෂානි සංසලා ගුණසේන- 9 වන ශ්‍රේණිය
ශ්‍රී උපනන්ද දහම් පාසල – නාරම්මලුව

## ඥාන විසඳුම්


දයාවංශ ජයකොඩි සහ සමාගම

**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

අපි පරිසරයට ආදරය කරමු යන මතෘකාව යටතේ කෙටි රචනාවක් නිර්මාණාත්මක ව ලියා අපවෙත එවන්න.

..................................................

ජයග්‍රාහී දරුවෙකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඩුරක් පිරිනැමේ.




බුදුසරණ

# පාලි පාඩම

41 කොටස

සැකසුම
කොටනෙලුවේ පුඤ්ඤානන්ද හිමි

## රුක්ඛලතා - ගස් වැල්

| | | |
|---|---|---|
| 1. | අඞ්ග | කොටස, අවයවය |
| 2. | අතිසයෙන | අතිශයින් |
| 3. | අප්පමෙය්‍ය | අප්‍රමාණ වූ |
| 4. | අම්බ | අඹ |
| 5. | උපකාරාවහ | උපකාර ඵලවන |
| 6. | එකජාති | එක් වර්ගයක් |
| 7. | කට්ඨ | දැව, ලී |
| 8. | කදලි | කෙසෙල් |
| 9. | කිච්ච | වැඩය |
| 10. | කුද්‍රූසක | කුරක්කම් |
| 11. | ගවාදීනං | ගවාදීන්ට |
| 12. | ඝරමාපන | ගෙවල් සෑදීම |
| 13. | ජීවිතුං | ජීවත්වන්ට |
| 14. | තිණජාති | තෘණ වර්ග |
| 15. | තිරච්ඡාන | තිරිසනා |
| 16. | දීප | දිවයින |
| 17. | පනස | කොස් |
| 18. | පල්ලව | දළුව |
| 19. | පසාඛා | රිකිල්ල |
| 20. | පාකට | ප්‍රකට |
| 21. | මූල | මූල |
| 22. | රුහති | වැඩේ |
| 23. | රොපීයති | වවනු ලැබේ |
| 24. | ලබුජ | දෙල් |
| 25. | විජ්ජති | විද්‍යාමාන වේ |
| 26. | සස්සජාති | සස්‍ය වර්ග |
| 27. | සංවිජ්ජති | විද්‍යාමාන වේ |
| 28. | සාඛා | අත්ත |
| 29. | සීතාධික දෙස | අධික සීතල ඇති රට |
| 30. | අතිපයොජනාවහ | අධික ප්‍රයෝජන ඵලවන |

## රුක්ඛලතා - ගස් වැල්

ඉමිස්සං පඨවියං අප්පමෙය්‍යා රුක්ඛලතා විජ්ජන්ති. තෙසු එකච්චෙව මනුස්සානං අතිපයොජනාවහා. අම්හාකං දීපෙ පනසා, ලබුජා, නාළිකෙරා, අම්බා, කදලීති ඉමෙ අතිසයෙන පාකටා. එකච්චෙසු සීතාධික දෙසෙසු ඉමෙ තරවො න රුහන්ති. ඉංගලීසීනං රට්ඨෙ ඉමෙසු එකජාතිපි න සංවිජ්ජති. තෙසං රට්ඨෙ විජ්ජමානානි එකච්චානි ඵලානි අම්හාකං රට්ඨෙ න සංවිජ්ජන්ති. රුක්ඛස්ස ඛන්ධො, මූලානි, සාඛා, පසාඛා, පණ්ණානි, පුප්ඵානි, ඵලානි, පල්ලවානීති අනෙකෙ අඞ්ගා. සස්සජාතියො පන රුක්ඛ - ලතාහිපි අධිකතරං මනුස්සානං උපකාරාවහා හොන්ති. ලඞ්කායමපන වීහිස්සමෙව අධිකං කුද්‍රූසකා එකච්චෙසු පදෙසෙසු රොපීයන්ති. රුක්ඛානං පණ්ණානිපි තිණජාතියොපි ගවාදීනං ආහාරො හොති. රුක්ඛානං කට්ඨෙහි ඝරමාපනාදීනි බහූනි කිච්චානි කරොන්ති. සචෙ ලොකෙ රුක්ඛ - ලතා න රුහන්ති, මනුස්සාපි තිරච්ඡානාපි ජීවිතුං න සක්කොන්ති.

මෙම පාඩම සතියෙ සිකුරාදා සහ ඉරිදා රාත්‍රී 08.45 ට බෞද්ධයා රූපවාහිනි නාලිකාවේ ද (The BuddhistTV) සඳුදා සවස 03.30 ට බෞද්ධයා ගුවන් විදුලි නාලිකාවේ ද විකාශනය වේ. ඔබට පසුගිය වැඩසටහන් සියල්ල අන්තර් ජාලයෙන් ද නැරඹිය හැකි ය. ඒ සඳහා පිවිසෙන්න. www.the buddhistTV / Magadhi (මාගධී) හෝ kotaneluwe thero (කොටනෙලුවේ හිමි) යනුවෙන් සොයන්න.

## බබ්බු ජාතක කතාව

# අන්සතු වස්තුවෙහි ලොබ බැඳීම විපතට මූලයි

**බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි දවසේ භික්ෂූන් වහන්සේලා සිව් නමක් විසින් තමාට පවරා නොදුන් දෙය අරගත් නිසා පැවිදි උතුමන් වහන්සේලාට මෙවැනි ශික්ෂා පදයක් පැනවුවා. එනම්, "පවරා දුන් දනක් විනා නොපවරා දුන් දනක් ගෙට ගොස් අරගැනීම අකැප" යි යනුවෙනි. එම සිද්ධියට හේතු වූයේ කාන මාතාවගේ කථාවයි.**



සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයේ සැවැත් නුවර කාන මාතාව නම් ආර්ය ශ්‍රාවක උපාසිකාවක් සිටියා. මෙම උපාසිකාවට කාන මාතාව යැයි කියන්නේ ඇයට සිටි කාන නම් දුව නිසායි. ඒ දුවට "කාන" යැයි කියන්නේ ඇස කණ නිසා නම් නොවේ. එම දියණියට විශේෂිත වූ රූප ශ්‍රීයක් තිබුණා. ඒ නිසා දුටු දුටු පුරුෂයන් ඇගේ රූප ශ්‍රීයෙහි තෘෂ්ණාවෙන් බැඳී අන් ස්ත්‍රීන් දෙස නොබලාම ඇයව ම ප්‍රාර්ථනා කළා. මෙසේ ඔවුන් ඇසක් කණ වූවන් මෙන් ඇයම ප්‍රාර්ථනා කළ බැවින් එම දියණිය කාන නමින් ප්‍රසිද්ධ වූවා. ඇගේ මව "කාන මාතා" නම් වූවා.

පසුව තම දියණිය නදුරු ගමක කුල පුරුෂයකුට විවාහ කර දුන්නා. ඇය කෙරෙහි බොහෝ ආදර ගෞරවයෙන් කටයුතු කිරීමට එම පුරුෂයා වගබලා ගත්තා. දිනක් තම මෑණියෝ බලන්නට කානාවෝ ගොස් එහි දින කිහිපයක් රැඳී සිටි නිසා සැමියා ඇයට "වහා නැවත ගෙදර එන්න." යැයි පණිවිඩයක් යැවුවා. ස්වාමියා බැලීමට යන ගමන හිස් අතින් යාම සුදුසු නොවේ යැයි මෑණියන් ලවා ගමනට අවශ්‍ය කැවුම් පිස නිමවූවා. ඒ අවස්ථාවේ භික්ෂූන් වහන්සේ නමක් ගෙදරට ම පිඬු සිඟා වැඩියා. ගෙදර කැවුම් තියාගෙන නැහැ කීම නුසුදුසු බැවින් කාන මාතාවෝ පාත්‍රය පුරවා කැවුම් බෙදුවා. එම භික්ෂූන් වහන්සේත් තවත් භික්ෂුවකට කැවුම් ලබා ගත් නිවසේ මං සලකුණු පෙන්වා "කාන මාතාවගේ නිවසට වඩින්න. එයින් කැවුම් ලබාගත හැකි" යැයි කීවා. උන්වහන්සේත් කාන මාතාවගේ නිවසට වැඩම කොට කැවුම් ලබා ගත්තා. එම අයුරින් සිව් නමක් ම ඇගේ නිවසින් කැවුම් ලැබුවා. ස්වාමියාට ගෙන යාමට කැවුම් ඉතුරු නොවුණ නිසා කානාව ගමන නතර කළා.

ස්වාමියා දෙවන වරටත් කානාවට වහා ගෙදර එන ලෙස කියා පණිවිඩ යැවුවා. එම අවස්ථාවෙත් කැවුම් පිස නිමවූවත් නැවත වැඩි ස්වාමින් වහන්සේලා නිසා දෙවන වරටත් ගමනට බාධා පැමිණුනා. එවරත් ගෙදර නොපැමිණි තම බිරිඳ පිළිබඳ උරණ වූ පුරුෂයා වෙනත් කුල නිවසකින් ආවාහයක් කර ගත්තා.

මෙම පුවත කානාවෝ ආසා බොහෝ වික්ෂේප ව හඬන්නට වුණා. කාන මාතාවෝ ද ශෝකයෙන් පීඩිත වුණා.

එම පුවත සර්වඥයන් වහන්සේ දැන කාන මාතාවගේ නිවසට වැඩම කොට සුදුසු පරිදි ධර්මය වදාරා ඔවුන්ගේ ශෝක සන්සිඳුවා ජේතවනාරාමයට ම වැඩියා. එදින සවස දම් සභා මණ්ඩපයේ දී රැස් වූ භික්ෂූන් වහන්සේලා අසවල් භික්ෂූන් වහන්සේලා හතරදෙනා නිසා කානාවට ස්වාමියා අහිමි වුණා. ආර්ය උපාසිකාවෝත් බොහෝ වික්ෂේප ව ශෝකයට පත් වී යැයි කතා කරමින් සිටියා. එම අවස්ථාවේ සර්වඥයන් වහන්සේ දම් සභාවට වැඩියා. "මහණෙනි, මා එන්නට ප්‍රථමයෙන් කුමක් ගැන කතා කරමින් සිටියේ" දැයි විචාළා. භික්ෂූන් වහන්සේලා කරමින් සිටි කතාව දැන් වූ පසු "මහණෙනි, දැන් පමණක් නොව, පෙරත් එම භික්ෂූන් වහන්සේලා සතර දෙනා විසින් කාන මාතාවගේ ලාභය ගත්තා" ලදැයි වදාරා ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ අතීත කතාව දේශනා කොට වදාළා.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍ය කරන සමයේ බෝධි සත්වයන් වහන්සේ ගල් වඩු කුලයක ඉපිද ගල් වඩුවන්ට ආචාරී ව ජීවත් වුණා. ඒ කාලයේ දී සතළිස් කෙළක්



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත

**කිවුලතලාවේ සමිත හිමි**

ධන සම්භාරයක් නිධන් ගත කර සිටි පිටිසර ගමක සිටුවරයෙක් හදිසියේ ම නැසී ගියා. ඔහුගේ බිරිඳ ද එම සතළිස් කෙළක් ධන සම්පත කෙරෙහි ආසාව උපදවා සිටියදී මියගොස් ධනය නිදන්කොට ඇති භූමියෙහි ම තුඹසක මී ධේනුවක් වී ඉපදුණා. මේ වන විට බෝධි සත්වයෝ ගල් පළා කර්මාන්ත කළේ, ඉතා දුක සේ ධනය ඉපයීම සඳහා එම පිටිසර ගමට සැමදා එන යන වග බලා සිටි මූසික ධේනුව බෝධි සත්වයන් කෙරෙහි ස්නේහයක් උපදවා "මාගේ සතළිස් කෙළක් ධනය මෙම සත්පුරුෂයාට දී මමත් ප්‍රයෝජන ලබමි" සිතා එක දවසක් කහවනුවක් කටින් ඩැහැගෙනවිත් බෝධි සත්වයන් පාමුල තැබුවා. බෝධි සත්වයෝ මේ කිමෙක්දැයි ඇසුවා. "සත්පුරුෂයාණෙනි, නුඹ මේ කහවනුව ගෙන මට වී ඇට සතරක ප්‍රමාණයේ මස් ගෙනත් දී ඉතිරිය ඔබ ප්‍රයෝජන ගන්න" යැයි මූසික ධේනුව කියා සිටියා.

එයට එකඟ වූ බෝධි සත්වයන්ට දිනකට එක් කහවනුවක් ගෙනත් දී රත්රන් සතරක වී ඇටයක දඩමස් ලබා බොහෝ සතුටින් ඒ මූසික ධේනුව කල් යැව්වා. දිනක් ගොදුරු සොයා යන බළලෙක් මෙම මූසික ධේනුව දැක අල්ලා ගත්තා.

"බළලාණෙනි, මා අතහැර මැනව"

"කොහොම අතහරින්නද? මා එන්නේ ගොදුරු සොයා ගෙන බොහෝ විලාවකට පසුවයි ගොදුරක් ලෙස ඔබව මට ලැබුණේ."

"මා අල්වා ගත්තේ කුමකට ද?"

"මස් කන්නට"

"ඔබ කැමති එක දවසක මස් කන්න ද? හැමදාම මස් කන්නද?"

"සැමදාටම" යැයි බළලා කිව්වා.

"එසේ නම් මා අතහරින්න. ඔබට මම හැමදාම මස් ලබා දෙන්නම්" යැයි පොරොන්දු පිට බළලාගෙන් මූසික ධේනුව ගැලවුණා. එදින සිට සැමදාම තමා ලබාදෙන කහවනුවට වී ඇට සතරක ප්‍රමාණයක මස් ලබා එයින් කොටසක් බළලාට දදී ජීවත් වුණා. ඔය අතරේ තවත් බළලෙකුට මූසික ධේනුව අසුවුණා. ඔහුටත් පෙර සේ ම කියා ගැළ වී ගියා. මෙසේ බළලුන් සිවු දෙනෙකුට මස් ලබා දීමේ පොරොන්දුවට ජීවිත දානය ලැබුවා. තමන්ට ලැබෙන මස් කොටස දැන් කොටස් 5 කට වෙන්කර එයින් එක් කොටසක් ආහාරයට ගත් නිසා මූසික ධේනුව දුර්වල වුණා. බෝධිසත්වයෝ ඇය එසේ වීමට කාරණා විමසා සිටියා. ධේනුවට සිදු වූ මෙම අකරතැබ්බය බෝධි සත්වයන්හට දැන් වූවා. "මෙතෙක් මට නොකීවේ" ඇයි දැයි අසා එයට පිළියමක් ලෙස දැවයෙන් කරන ලද කරඬුවක් කරවා එහි ඇතුළත මූසික ධේනුවට ඉන්නට ඉඩ සලස්වා "මස් ඉල්වා එන බළලුන්ට පරිභව කරවයි" කීවා. මේ ආකාරයට පළමු කොට බළලෙක් මස් ඉල්ලා පැමිණියා. එවිට "නුඹට මස් දෙන්නට මා කවුද?" යැයි කියමින් බළලා කිපෙන අයුරින් මූසික ධේනුව පරිභව කළා. බළලා කේන්ති අරගෙන එක පාරටම කරඬුවට පැන්නා. එයින් බළලාගේ පපුව පැළී ගියා.

මේ අයුරින් බළලුන් සතර දෙනාම මරණයට පත්වුණා. එතැන් පටන් මූසිකාව බෝධිසත්වයන් කෙරේ පැහැදී දිනකට කහවනු දෙක බැගින් ලබා දුන්නා. මේ ආකාරයට තමාගේ සතළිස් කෙළක් ධනය බෝධි සත්වයන්ටම දුන්නා. යැයි කියමින් බුදුරජාණන් වහන්සේ අතීත කතාව නිමවා වදාළා. "මහණෙනි, බළලුන් සතර දෙනා මස් කෑමෙන් මූසිකාවට වූ අලාභය මෙන්ම මේ කානා උපාසිකාවට ද මහත් අලාභයක් වුණා." "ඒ නිසා අද පටන් පවරා දුන් දනක් විනා නොපවරා දුන් දනක් ගෙට ගොස් ඇරගැනීම අකැප" යැයි භික්ෂූන් වහන්සේලාට විනය ශික්ෂා පදයක් පැනවූවා.

"මහණෙනි, එසමයෙහි බළලුන් සතර දෙනා මේ කාන මාතාවගේ නිවසට පැමිණි භික්ෂූන් සතර දෙනාමයි." මූසික ධේනුව නම් මේ කාන මාතා උපාසිකාවයි. ඒ සමයෙහි ගල්වඩුවා ව උපන්නේ ලොව්තුරා බුදු වූ මම්ම නොවේ දැයි පෙරාපර සන්ධි ගළපා මේ බබ්බු ජාතකය දේශනා කොට වදාළා.

බුදු සරණ



## අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිරුව තාරා දෙවඟනගේ පිළිරුව එක පෙළට මතුකර ඇති

# වැල්ලවාය බුදුරුවගල පුදබිමේ අසිරිය



**“බුදුරුවගල” මෙම පුද බිම මෙකල හඳුන්වන නාමයයි. බුදුරුවක් පිහිටි ගලෙහි මතුකර (අල්ප උන්නත ලෙස) නෙළා ඇති නිසා මේ පුදබිමට ඒ නාමය හඳුන්වා ඇතත් මෙහි විශාලතම බුදුරුව අඩි 52 පමණ උස ය. ඒ බුදු පිළිම වහන්සේ පමණක් නොව අවලෝකිතේශ්වර බෝධිසත්ව රූපය, තාරා දෙවඟනගේ රූපය ද තවත් එවැනි පිළිම කීපයක් ම මෙම පිහිටි ගලෙහි එක පෙළට මතුකර දක්වා තිබේ.**

වැල්ලවායේ බුදුරුවගලට සමාන වූ ස්ථානයක් ලංකාවේ වෙනත් තැනක දැකිය හැකි නොවේ. එම නිසා අපේ පුරාණ ශ්‍රී ලංකාවේ බෞද්ධ මූර්ති නිර්මාණ අතර ඉතා විශේෂිත වූ පුදබිමක් ලෙස බුදුරුවගල හඳුන්වා දිය හැකි ය.

වැල්ලවාය නගරයේ දකුණු දෙසට යන විට බුදුරුවගල විදුහල හමුවේ. ඊට ඉදිරිපසින් බටහිර දෙසට ඇති පාරේ ටික දුරක් යන විට බුදුරුවගල ගම්මානය ද, වැව ද හමුවේ. එම වැව පසුකර කිලෝමීටර් පහක් (5) පමණ ඉදිරියට යනවිට භාවනා මධ්‍යස්ථානය හමුවෙයි. එය ඉදිරිපිට ඇති රිය නැවතතුම් පළ පසුකර මද දුරක් මහ වනය මැදින් ඉදිරියට යන විට කඳු වැටියක් හමු වේ. මේ කඳු වැටිය මැද විශාල පර්වතයක මෙම ප්‍රතිමා වහන්සේ නෙළා තිබෙනු දැකිය හැකි ය.

මෙහි ඇති සියලුම ප්‍රතිමා පිහිටි ගලෙහි මතුකර, මැටි බදාමයෙන් ඒවා නැවත මතුකර නිර්මාණය කර තිබේ.

මෙහි විශාල ම පිළිමය බුදු පිළිම වහන්සේ වේ. එම බුදු පිළිම වහන්සේගේ දකුණු අත අභය මුද්‍රාවෙන් ද, වම් අත කටක හස්ත මුද්‍රාවෙන් ද නෙළා තිබේ. මෙහි එක පෙළට ඇති අනෙක් ප්‍රතිමා හයම මෙම බුදු පිළිම වහන්සෙට වඩා උසින් අඩු ය. මෙම බුදුරුවෙහි වම් අතෙහි වම් උරහිස මත තබා පහතට වැටෙන සිවුරු කොන රඳවා සිටින ලෙස නෙළා තිබේ. මෙම බුදු පිළිම වහන්සේ දෙපස බෝධිසත්ව රූප දෙකක් නෙළා ඇත.

අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාවෙහි ජටාමකුටය හෙවත් ශීර්ෂාභරණයෙහි දඹේගොඩ බෝසත් පිළිමයෙහි මෙන්ම සමාධි බුදුරුවක් නෙළා තිබේ. මේ නිසා මෙය අවලෝකිතේශ්වර බෝසත් පිළිමයක් ලෙස හඳුනාගත හැක. උඩුකය එහි විවෘත ය. යටිකය සළුවකින් සැරසී ඇත. දෑත උරහිස තෙක් ඔසවා සිටින ලෙස නෙළා ඇත. අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිම වහන්සේ තේජාන්විත භාවයක් පෙන්නුම් කරයි. අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිම වහන්සේට අමතරව (බුදු පිළිම වහන්සේ හැර) තවත් පිළිම පහක් මෙහි නෙළා ඇත. බෝධිසත්ව රූප දෙකක්, බුදු පිළිම වහන්සේ දෙපස ද සුධන කුමාර හා තාරා දෙවඟනගේ ප්‍රතිමාවක් ද මෙහි දක්නට ලැබේ.

බුදුරුවගල මෙම පිළිමවලට ඉහළින් ආවරණයක් හෝ පියස්සක් (වහලයක්) පවතින්නට ඇත. එම මහා ගල්කුල හාරා ඇති කුහර වලින් ද, පැරණි උළු කැට කැබලි ද මේ සඳහා සෙවණක් පැවති බවට සලකුණු කරයි. (හෙළ කලා විස්කම් සිරිසමන් විජේතුංග – පි. 98 – 99 )

මෙම ප්‍රතිමා නිර්මාණය කළ කාලය පිළිබඳ සඳහන් කරන විට ක්‍රිස්තු වර්ෂ 7 හා 8 සියවස්වලට අයත් යැයි සැලකිය හැකි ය. බුදු පිළිම වහන්සේ සමඟ මෙහි නෙළා ඇති මහායාන බුදු සමයට අයත් ප්‍රතිමා අනුව මේවා රෝහණ දේශයේ විසූ මහායානිකයන්ගේ විශිෂ්ට නිර්මාණ ලෙස සැලකිය හැකි ය. ලක්දිව වෙනත් ප්‍රතිමා මෙන් මෙම බුද්ධප්‍රතිමා වහන්සේ හොඳින් ගලෙහි මතුකර නෙළා නැත. එහෙත් එහි සියුම් විස්තර ඒ මතුපිට ආලේප කරන ලද බදාමයෙන් මතු කරන්නට ඇතැයි සිතිය හැකි ය. වෙනත් ලාංකික බුද්ධ ප්‍රතිමා වහන්සේලාගේ මෙන් ඒකාංශ පාරුපනයෙන් (සිවුර නෙළා ඇති අන්දම) යුක්තව ද, වම් අතින් සිවුර දරා සිටින ලෙසින් ද, දකුණු අතින් අභය මුද්‍රාව නිරූපණය වන ලෙසින් ද මෙම බුදුරුවගල බුදු පිළිම වහන්සේ නෙළා තිබේ. මෙම පිළිම වහන්සේගේ සිවුර සායම්වලින් වර්ණවත් කර තිබූ ලකුණු මෙහි දක්නට ලැබේ.

හතරැස් ස්වරූපයක් ගන්නා මෙම බුදු පිළිම වහන්සේගෙ මුහුණෙහි නාසය මතුපිට පැතලි බවක් ගනී. දෙකන් හොඳින් සාද ඇත. දකුණු ඇස රේඛාමය ස්වභාවයකින් දක්වා ඇතත්, වම් ඇස හොඳින් නෙළා ඇත. බුදුපිළිම වහන්සේ උෂ්ණීසය (හිස මුදුණ) සහිත කෙහෙරැලි දක්වා තිබුණත් ඒවායේ රැලි බවක් නැත. දෙතොල් තීව්‍ර ලෙස මතුකර ඇති නිසා එය මුහුණෙන් එළියට මතු වී තිබේ.

එසේ වුව ද මේ ප්‍රතිමා වහන්සේ ගලින් යාන්තමට මතුකර දක්වා ඇති නිසා දෙපතුල් සහ පද්මාසනය වෙනම සාද ඊට සවිකර තිබේ. 1968 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ පිළිම වහන්සේගේ කැඩී බිඳී ගිය තැන් පිළිසකර කර තිබේ. (ලක්දිව බුද්ධ ප්‍රතිමා – මහාචාර්ය මාලිංග අමරසිංහ පි. 109 – 110 – 2010 – දයාවංශ ජයකොඩි සහ සමාගම)

බුදුරුවගල බුදු පිළිම වහන්සේට දකුණු පැත්තේ ඇති අවලෝකිතේශ්වර බෝසත් පිළිමයට වම් පසින් තාරා දෙවඟනගේ රූපය නෙළා ඇත. අල්ප උන්නත ලෙස සාද ඇති ශ්‍රී ලංකාවෙන් මෙතෙක් ලැබී ඇති විශාලතම තාරා දෙවඟන රූපය මෙය වේ. මෙහි ත්‍රිභංග ඉරියව්වෙන් යුත් තාරා ප්‍රතිමාව අඩක් ඔසවන ලද දකුණු අතින් කටක මුද්‍රාව දක්වයි. පහළට හෙළන ලද වම් අතෙහි අමෘත කලස වෙයි. යටිකයේ ධෝතිය (ඇඳුම) පහළට ඇත. උඩුකය විවෘත ය. ආභරණ නැත. හිසේ (ශීර්ෂාභරණය) ජටාමකුටය වේ.

බුදුරුවගල පිහිටි මෙම මූර්ති නිර්මාණ අපගේ පුරාණ බෞද්ධ කලා ශිල්පීන්ගේ නිර්මාණාත්මක භාවය මනාව හෙළි කරන්නකි.



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ
හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ

වර්ෂ 2020 ක් වූ අගෝස්තු 18 අඟහරුවාද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.